
# ආහාර පද්ධතීන් පරිවර්තනයෙහිලා කාන්තාවන්ගේ කාර්යභාරය:

## ජනතා ආහාර පද්ධතියක් උදෙසා සිවිල් සමාජ සංවිධාන නිර්දේශ



හවුල්කාරීත්වය:

WE EFFECT

ක්‍රියාත්මක කිරීම:

LAW & SOCIETY TRUST

SAVISTHRI

# ආහාර පද්ධතීන් පරිවර්තනයෙහිලා කාන්තාවන්ගේ කාර්යභාරයඃ

## ජනතා ආහාර පද්ධතියක් උදෙසා සිවිල් සමාජ සංවිධාන නිර්දේශ

**නීතිය සහ සමාජ භාරය සහ සවිස්ත්‍රී කාන්තා ව්‍යාපාරය විසින්, We Effect සමග සිදුකරන ලද ජනතා අදහස් විමසීමේ සැසි මත පදනම් ව සකස් කරනු ලැබූ ඒකාබද්ධ වාර්තාව**

**සම්පාදනය:**

ආචාර්ය නිසාදි සෝමරත්න

රශ්මිනි ද සිල්වා

**කවරයේ සිතුවම:**

දිල්රුක්ෂි ද හේරත් BVA (Special) Honours

**පිටු සැකසුම:**

දුශාන්ත කුමාර

**ප්‍රකාශනය:**

නීතිය හා සමාජ භාරය
03, කින්සි ටෙරස්,
කොළඹ 08,
ශ්‍රී ලංකාව
+94 (0) 112684845
+94 (0) 112686843
info@lstlanka.org
www.lstlanka.org

# හැඳින්වීම

එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළුව 2021 සැප්තැම්බර් මාසයේ දී පැවැත්වෙන්නේ වෙන කවරදාටත් වඩා අපේ ආහාර පද්ධති සම්පූර්ණයෙන් වෙනස් කිරීමේ අවශ්‍යතාව ලෝකයට දැනී ඇති පසුබිමක ය. නීතිය සහ සමාජ භාරය සහ සවිස්ත්‍රී කාන්තා ව්‍යාපාරය, ශ්‍රී ලංකාවේ ගොවි කාන්තාවන් සහ ඔවුන්ගේ සංවිධාන සමග පවත්වනු ලැබූ සාකච්ඡා මාලාවක් පදනම් කරගනිමින් මෙම නිර්දේශ සකස් කර ඇත. අපගේ ආහාර පද්ධති පූර්ණ පරිවර්තනයකට ලක්කිරීමට එමඟින් නිර්දේශ කරනු ලබන අතර කාන්තා නිෂ්පාදකයින් එහි නායිකාවන් ලෙස පිළිගත යුතු බව අවධාරණය කරයි. සමාගම්වල වුවමනාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන වර්තමාන කාර්මික ආහාර පද්ධතියෙන් පීඩාවට පත් කුඩා නිෂ්පාදකයින්ගේ හා ජනතාවගේ හඬ කෙරෙහි එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළුව එතරම් අවධානයක් යොමු නොකරනු ඇති බවට අනෙකුත් සිවිල් සමාජ සංවිධාන හා සමාජ ව්‍යාපාර විසින් එල්ල කරනු ලබන විවේචනය සමග අප ද එකඟ වන්නෙමු.[1]

මෙම ලේඛනයේ නිර්දේශ විසින් සුළු පරිමාණ නිෂ්පාදකයින්ගේ, පාරිභෝගිකයින්ගේ සහ ස්වභාවධර්මයේ අවශ්‍යතා හා අයිතිවාසිකම් කේන්ද්‍රකොටගත් ආහාර පද්ධතියකට මඟ පාදනු ඇති බවටත්, සමාගම්වල ලාභය පරයා ආහාර ස්වෛරීභාවයට මුල්තැන දෙනු ඇති බවටත් අපි බලාපොරොත්තු වෙමු.

---

1 https://www.foodsovereignty.org/wp-content/uploads/2020/02/EN_Edited_draft-letter-UN-food-systems-summit_070220-4.pdf

මෙම සංවාදයට ගෝලීය මට්ටමේ දී පහසුකම් සලසමින් We Effect තම ස්ථාවරය එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළුවට නැවතත් අවධාරණය කරයි. We Effect හී අපේක්ෂාව වන්නේ:

- සමුළුව වෙනුවෙන් ස්ථාපිත කොට ඇති විවිධ ඩිජිටල් තැපැල් පෙට්ටිවලට අපගේ ආදාන ලබාදීම වෙනුවෙන් වන (දේශීය හා ගෝලීය) ආදාන මූලාශ්‍රයක් බවට පත්වීම.
- එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළුව සම්බන්ධ සාකච්ඡා හා සංවාද මණ්ඩප තුළ අපගේ සහභාගීත්වය සඳහා තර්කන සහ මූලික පණිවුඩ ලබා දීම.
- We Effect සහ Vi Agroforestry විසින් සුසම්බන්ධ කරනු ලැබූ ඒකාබද්ධ ගෝලීය උද්දේශන උපායමාර්ගය සහ අන්තර්කාලීන උපායමාර්ගය මත පදනම් වූ ආහාර සඳහා අයිතිය පිළිබඳ සාකච්ඡා සහ තීව්‍ර උද්දේශන ප්‍රමුඛතාවන් සඳහා අවකාශයක් නිර්මාණය කිරීම.
- එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළුව සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන සාමාජික සංවිධාන සමඟ සම්බන්ධ වීම.

එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළුව සඳහා We Effect හී ප්‍රධාන පණිවිඩය වන්නේ: 'ආහාර පද්ධතීන්ගේ තීරණාත්මක කේන්ද්‍රීය සාධකය ලාභය නොව ජනතාව විය යුතුය!' යන්නයි.

සංවාද තුළ දී තම ස්ථාවරය නැවත අවධාරණය කරනු පිණිස We Effect මතු සඳහන් ආධාරක පණිවුඩ භාවිත කිරීමට අපේක්ෂා කරයි. එක්සත් ජාතීන්, රජයන් සහ සිවිල් සමාජ සංවිධාන සමඟ වන සිය සංවාදයන් හි දී ආධාරක පණිවුඩ ඔස්සේ මෙම පණිවිඩය සහ ස්ථාවරය We Effect විසින් නැවතත් අවධාරණය කරයි.

- මානව හිමිකම් මත පදනම් වූ, දේශපාලන හා ව්‍යුහාත්මක වෙනස්කම් අවධාරණය කිරීම
- සංවර්ධනය තුළ අර්ථාන්විත රාජ්‍ය/සිවිල් සහභාගීත්ව සහතික කිරීම හා සිවිල් අවකාශය හැකිළී යාමට එරෙහි ව කටයුතු කිරීම
- සංවර්ධනයේ දී කුඩා පරිමාණ ගොවියාගේ භූමිකාව පිළිගැනීම/ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම
- අද්දැකීම් මත පදනම් වූ සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයට ගරු කිරීම
- පර්යේෂණවල ප්‍රතිලාභ කුඩා පරිමාණ නිෂ්පාදකයින්ට ලැබෙන බව සහතික කිරීම
- ජාතික සාකච්ඡාවන් තුළ ට ගෝලීය පර්යාලෝකයක් ඇතුළත් කිරීම

එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළු සංවාදය We Effect මෙම ස්ථාවරය ඉදිරිපත් කරනුයේ සමූපකාර සහ ගොවි හා සිවිල් සමාජ සංවිධානයන්ගෙන් සමන්විත සිය හවුල්කරුවන් වෙනුවෙනි.

ආහාර සුරක්ෂිතතාව හා සම්බන්ධ කරුණු පිළිබඳ ව ශ්‍රී ලංකාවේ ජනතාවගේ ස්වාධීන අදහස් රැස් කිරීම වෙනුවෙන් We Effect ශ්‍රී ලංකා කාර්යාලය සිය හවුල්කාර සංවිධාන වන නීතිය හා සමාජ භාරය සහ සවිස්ත්‍රී සමඟ එක් ව කටයුතු කරන ලදී. විශේෂයෙන් ම මෙම හවුල්කාරීත්වය මගින් ශ්‍රී ලංකාවේ සමූපකාර හා ගොවි කාන්තාවන්ගේ හඬ ගෝලීය අවකාශයකයට ගෙනවිත් ඇති අතර, මෙම ලේඛනයේ අන්තර්ගත නිර්දේශ විසින් සුළු පරිමාණ නිෂ්පාදකයින්ගේ, පාරිභෝගිකයින්ගේ සහ ස්වභාවධර්මයේ අවශ්‍යතා, උවමනාවන් හා අයිතිවාසිකම් කේන්ද්‍රගත කරන, සමාගම්වල ලාභ ඉපැයීම්වලට වඩා ආහාර ස්වෛරීභාවයට ප්‍රමුඛස්ථානය දෙන ආහාර පද්ධතියක් කරා මඟ පාදනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

# පසුබිම

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වැදගත් භූමිකාවක් කාන්තාවන් විසින් ඉටු කරන නමුත් ජාතික ප්‍රතිපත්ති රාමු තුළ ඔවුන්ගේ දායකත්වය පිළිගැනීමක් හෝ නිරූපනය වීමක් සිදු නොවේ. ආහාර නිෂ්පාදනයේ දී කාන්තාවන්ගේ දායකත්වය තීරණාත්මක ය. ලොව පුරා වගා කරන ආහාර වලින් 50% කට වඩා නිෂ්පාදනය කරනු ලබන්නේ දකුණු ආසියාවේ සහ උප සහරා අප්‍රිකාවේ කාන්තාවන් විසිනි (ආහාර හා කෘෂිකර්ම සංවිධානය, 2011). කෙසේ වෙතත්, ආහාර පද්ධති ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ පවුල්, ප්‍රජාවන්ගේ සහ රටවල ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම සඳහා කාන්තාවන් සිය පූර්ණ ශක්‍යතාවන් භාවිත කිරීම වලක්වන හෝ ඊට බාධා බාධක ගණනාවකටම ලොව පුරා කාන්තාවෝ මුහුණ දී සිටිති. ශ්‍රී ලංකාව ද එහිලා ව්‍යතිරේඛයක් නොවේ. (ද සිල්වා, 2020).

ලෝකයේ තුනෙන් දෙක ක ම කාන්තාවෝ නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් වශයෙන් ආහාර ආර්ථිකයේ තීරණාත්මක භූමිකාවක් ඉටු කරති. ඉඩම්, ණය සහ තොරතුරු සඳහා අසමාන ප්‍රවේශයක් තිබිය දී ත් මෙවන් සුවිසල් භූමිකාවක් ඉටු කිරීමට කාන්තාවන්ට හැකිවීම තුළ ගොවීන් ලෙස ඔවුන් ඉටුකරන භූමිකාව පිළිබඳ අප තවදුරටත් ගවේෂණය කළ යුතු ය (ශිවා, 1996).

අපගේ ආහාර පද්ධතිය, සමාජ සාධාරණත්වය හා සමානාත්මතාව යන මූලධර්ම මත පදනම් වූ, සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින්, විශේෂයෙන් ම කාන්තා නිෂ්පාදකයින්, මුල් කරගත්, කෘෂිපාරිසරික විද්‍යා රාමුවක් මත ගොඩනැගුණු පරිවර්තනයක් කරා මග පෙන්විය හැකි කාලීන හා යථාර්ථවාදී සාක්ෂි මෙම වාර්තාව මගින් ඉදිරිපත් කරයි.

මතු සඳහන් දේවල් පුළුල් ව සකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ:

1. වත්මන් තත්ත්වය වටහා ගැනීම: ශ්‍රී ලංකාවේ ගොවි කාන්තාවන් මුහුණ දෙමින් සිටින යථාර්තය වටහා ගැනීම
2. බිම් මට්ටමේ සාක්ෂි එකතු කිරීම: ගොවි කාන්තාවන් මුහුණ දෙන ප්‍රධාන ම බාධක මොනවාද
3. ප්‍රතිපත්තිමය අඩුපාඩු හඳුනාගැනීම සහ නිර්දේශ සකස් කිරීම

මෙම වාර්තාව සඳහා සාක්ෂි එකතු කිරීමේ ක්‍රියාවලියේ දී ගොවි කාන්තාවන්, ගොවි නායිකාවන්, සමූපකාර හා සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින් හා වී ඉෆෙක්ට් හවුල්කාර සංවිධාන නියෝජිතයින් 100 ක් පමණ සමග සාකච්ඡා පවත්වනු ලැබිණි. ඒ සඳහා වූ සැසි දිවයිනේ පළාත් පහක සංවිධානය කරනු ලැබිණි.

- අනුරාධපුර (උතුරු මැද පළාත)
- මඩකලපුව (නැගෙනහිර පළාත)
- වවුනියාව සහ මුලතිව් (උතුරු පළාත)
- නුවරඑළිය (මධ්‍යම පළාත)
- හම්බන්තොට (දකුණු පළාත)



# 01
# ශ්‍රී ලංකාවේ ගොවි කාන්තාවන්ගේ වර්තමාන තත්ත්වය

## 1.1 බිඳී විසිරුණු ආහාර පද්ධතියක් සමඟ කරන සටන

සෑම ආකාරයකම දිළිඳුකම, සාගින්න සහ මන්දපෝෂණය පිටු දැකීම හා යහපත් සෞඛ්‍ය හා සුබසාධනය යථාවක් බවට පත් කරන අතර පාරිසරික තිරසරභාවය ප්‍රවර්ධනය කිරීම ඇතුළු තිරසර සංවර්ධන ඉලක්කයන්හී ගැබ් ව ඇති එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල ප්‍රධාන ඉලක්ක ගණනාවක ම අන්තර් ඡේදන ස්ථානයක ආහාර පද්ධති ස්ථානගත වී ඇත (ASN, 2020).

*කාර්මික ආහාර නිෂ්පාදනය දැවැන්ත ලෙස සිදුවන සන්දර්භයක් තුළ පවා ලොව පුරා සෑම 10 දෙනෙකුගෙන් 1 අයෙකු ප්‍රමාණවත් ආහාර නොමැතිව පීඩා විඳින අතර බිලියන 3 කට අධික ජනතාවකට සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ලබා ගැනීමට නොහැකි වී තිබේ (ලෝක ආර්ථික සංසදය, 2021). ලෝකයේ ආහාර නිෂ්පාදනයෙන් 50% කටත් වඩා වැඩි ප්‍රමාණයක් තිරසර හා සාධාරණ නොවේ. අද වන විට පෘථිවියේ භූමි ප්‍රමාණයෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් ආහාර බෝග වගා කිරීම සඳහා එළි පෙහෙළි කරනු ලැබ ඇත.*

### 1.1.1 කෝවිඩ් -19 වසංගතය හමුවේ කාර්මික ආහාර නිෂ්පාදනයේ අසාර්ථකත්වය

අපගේ ආහාර පද්ධතිය දැනටමත් බිඳී ගොස් ඇති අතර, ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට එය අසමත් වී තිබේ. කුපෝෂණ සහ මන්ද පෝෂණ ගැටලු නිසා වසය අවුරුදු 15 - 49 ත් අතර කාන්තාවන්ගේ 32.36% ක් රක්තහීනතාවෙන් පෙළෙන අතර, 15.9% ක් ළදරුවන් උපතේ දී අඩු බර සහිත වූවන් වේ. අපගේ ආහාර අවශ්‍යතා සපුරාලීම සඳහා අප තවමත් බොහෝ දුරට ආනයනික ආහාර මත යැපෙන අතර, විශේෂයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ සුමට ව ක්‍රියාත්මක නොවන මෙවැනි අවස්ථාවල දී අපගේ ආහාර සුරක්ෂිතතාව අනතුර ට ලක් ව තිබේ.

ගොවීන් සඳහා තිරසර ජීවනෝපායයක් සහතික කිරීමට අපගේ කෘෂිකාර්මික පද්ධතිය අසමත් වී තිබේ. කෘෂිකර්මය තුළ ඉහළ යමින් ඇති සමාගම්වල පාලනය මගින් කුඩා පරිමාණයේ කෘෂි නිෂ්පාදකයින් ඔවුන්ගේ ඉඩම් වලින් හා ජීවනෝපායයන්ගෙන් පලවා හරිමින් තිබේ. ශ්‍රී ලංකාවේ දුප්පතුන්ගෙන් 80% කටත් වඩා වැඩි ප්‍රමාණයක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන බැවින් ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවනෝපාය කෙරෙහි බලපාන බරපතළ ගැටලු බොහෝ දුරට කෘෂිකර්මාන්තය හා සම්බන්ධ ඒවා වේ. දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය පසුගිය දශක දෙක තුළ ශීඝ්‍රයෙන් පහත වැටී තිබේ. ග්‍රාමීය ආර්ථිකය ගෞරවනීය ජීවනෝපාය මාර්ගයන් ලබා දීමට අසමත් වීම පසුගිය වසර 40 තුළ රටේ තරුණ නැගිටීම් වලට බලපෑ ප්‍රධාන හේතුවක් ලෙස ද හඳුනාගෙන තිබේ.

අපේ ආහාර පද්ධතිය ප්‍රධානතම පාරිසරික දූෂකයක් බවට ද පත් වී තිබේ. අපේ ජලය සහ පස දූෂණය කිරීමට පමණක් නොව සමස්ත ජනතාව ම දැඩි සෞඛ්‍ය අවදානමකට ලක් කිරීමට දායක වූ ලොව වැඩියෙන් ම කෘෂි රසායන භාවිත කරන රටක් බවට ශ්‍රී ලංකාව පත් වී තිබේ. වියළි කලාපයේ ගොවීන් අතර බහුල ව දැකිය හැකි නිදන්ගත වකුගඩු රෝගය මේ සංසිද්ධිය සඳහා හොඳ උදාහරණයකි. මහා පරිමාණ ඒක බෝග වගාවන් හේතුවෙන් වනාන්තර, ජල පෝෂක හා ජෛව විවිධත්වය විශාල ලෙස විනාශ වී තිබේ.

කාර්මිකකරණය, නාගරික සංවර්ධනය සහ අපනයන කේන්ද්‍ර කරගත් භාණ්ඩ නිෂ්පාදනයට ප්‍රමුඛත්වය දුන් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති දේශීය කෘෂිකර්මාන්තය සහ ආහාර ආරක්ෂක පද්ධති බිඳ හෙළා තිබේ. ග්‍රාමීය කෘෂිකර්මාන්තය සඳහා වන රජයේ ආයෝජනය ශීඝ්‍රයෙන් අඩු කිරීම, දේශීය ගොවීන්ට අවශ්‍ය ආරක්ෂාව සහ සහයෝගය නොමැතිවීම, ගැටුම් සහ ස්වභාවික විපත් හේතුවෙන් ආහාර නිෂ්පාදනය සහ සමස්ත ආහාර පද්ධතිය ම ඉතා ඉහළ අවදානමකට ලක් වී තිබේ.

කොවිඩ් වසංගතය හේතුවෙන් ගොවි කාන්තාවන් මුහුණ දෙන අසමානතාවන් සහ වෙනස් කොට සැලකීම් තවත් උග්‍ර වී ඇති බව ක්ෂේත්‍රයෙන් ලැබෙන සාක්ෂි අනුව පැහැදිලි ලෙස ම පෙනී යයි.

> *කොවිඩ් -19 හේතුවෙන් ඇති වන ආර්ථික පසුබෑම් දීර්ඝ කාලීන වනු ඇති අතර තිරසර සංවර්ධන කතිකාවන් විසින් වඩ වඩා අවධාරණය කරමින් සිටින්නේ රටක ආර්ථිකය යළි ගොඩ නැගීමේ මාවත වැටී ඇත්තේ කෘෂිකර්මාන්තය මගින් බවයි. ඌන පූරක ශ්‍රම බලකායක් ලෙස නොව ගොවි කාන්තාවන්, ව්‍යවසායිකාවන් සහ නායිකාවන් ලෙස එකී කෘෂිකර්මාන්තයේ අත්‍යන්ත අංගයක් වීමේ හැකියාව කාන්තාවන්ට තිබේ. ශ්‍රී ලංකාව තුළ ගොවි කාන්තාවන් සංවර්ධනයේ හවුල්කරුවන් ලෙස පිළිගත යුතු අතර, එය යථාවක් බවට පත්කරගනු පිණිස මුලින් ම කළ යුත්තේ එහි දී කාන්තාවන් මුහුණදෙන අභියෝග සඳහා පිළිතුරු සම්පාදනය කිරීමයි (ද සිල්වා, 2020).*

ලොව පුරා මෙන්ම ශ්‍රී ලංකාවේ ද COVID-19 ව්‍යාප්තියත් සමඟ ආහාර නිෂ්පාදනය හා බෙදාහැරීම ඇනහිටින ලදී. වසංගතය පැතිරීම වැලැක්වීම සඳහා පනවා තිබූ ඇඳිරි නීතිය සහ සංචරණ සීමා ගොවීන්ගේ ජීවනෝපාය දැඩි ලෙස අනතුරේ හෙලමින් රටේ සමස්ත ආහාර පද්ධතිය සහ ආහාර සුරක්ෂිතතාව අනතුරට ඇද දැමීමට හේතු විය.

COVID-19 ව්‍යාප්තිය රටේ ආහාර පද්ධතියට දැඩි ලෙස බලපෑම් ඇති කළේ ය. ගෝලීය වටිනාකම් දාමයන් හී බිඳ වැටීම හා කෘෂි රසායනික ද්‍රව්‍ය හා පොහොර ආනයනය කිරීමේ සීමාවන් හේතු කොටගෙන පාරිසරික කෘෂිකාර්මික පිළිවෙත් මත පදනම් ව දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවශ්‍යතාව ඉස්මතු වී ඇත. ගත වූ වසර 30 තුළ ක්‍රියාත්මක කරනු ලැබූ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති මගින් මුළුමනින් ම හැල්ලුවට ලක් වූ යැපුම් ගොවිතැන, දේශීය ආහාර නිෂ්පාදනය සහ සුළු පරිමාණ ගොවීන්ට සහයෝගය දැක්වීමේ වැදගත්කම නැවත තක්සේරු කිරීමටත්, සිදු වූ වැරදි නිවැරදි කිරීමටත් මෙය අවස්ථාවක් කරගත යුතු ය.

1960 දශකයේ හරිත විප්ලවය වැළඳගත් දා සිට, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය තුළ රසායනික යෙදවුම් භාවිතය ශීඝ්‍ර ලෙස ඉහළ ගොස් තිබේ. මෙය ගොවීන් තිරසර නොවන කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීමට සහ සාම්ප්‍රදායික දැනුම අත්හැරීමට, බෝග විවිධාංගීකරණයෙන් වැලකී සිටීමට සහ ඒක බෝග වගාවන් අනුගමනය කිරීමෙන්, පස නිසරුවීමට හා ගුණාත්මකව පහළ වැටීමට, පාරිසරික තුලනය බිඳවැටීමට සහ නිදන්ගත වකුගඩු රෝගය වැනි රෝග ව්‍යාප්ත වීමට හේතු වී ඇත. ඒක බෝග වගාව ප්‍රවර්ධනය කිරීම කෘෂිකාර්මික නවීකරණය කිරීමේ ප්‍රතිඵලයකි. COVID-19 හී බලපෑම් සම්බන්ධයෙන් ගොවි කාන්තාවන් අතර ඇති පොදු හැඟීමක් නම්, ආහාර හිඟයකට මුහුණ දෙන ගොවියෙකුගේ නිවසක් ඔවුන්ගේ පෙර පරම්පරාවල නම් අසාවත් නොතිබූවක් වන බවයි. එක් බෝගයක් පමණක් වගා කළ ගොවීන්ට එය ප්‍රමාණවත් ආහාර ප්‍රභවයක් ලෙස ගෘහස්ථ පරිභෝජනය සඳහා භාවිත කිරීමට නොහැකි වනවා මෙන්ම කොවිඩ් සංචරන සීමා හේතු කොටගෙන එකී අස්වැන්න වෙළෙඳපොළේ විකිණීම ට ද කළ නොහැකි ය. අදහස් විමසීමේ සැසි විසින් අනාවරණය කරන ලද්දේ ලංකාවේ ගොවීන් ඒක බෝග වගාවන් වෙත මාරු වීම වැඩි වී ඇති බවත්, ඒ සඳහා රජය විසින් ලබාදෙන දිරිගැන්වීම් මෙන්ම කෘෂි ව්‍යාප්ති සේවාවන් ද බලපා ඇති බවයි.

## 1.2 සාධාරණ ආහාර පද්ධතියක් සඳහා කාන්තාවන්ගේ භූමිකාව තීරණාත්මකයි

**බෝග වගා කිරීම, පශු සම්පත් කළමනාකරණය, ආහාර සැකසීම, බීජ සංරක්ෂණය සහ සාම්ප්‍රදායික දැනුම හුවමාරු කර ගැනීම යනා දී වශයෙන් ආහාර පද්ධති තුළ කාන්තාවන් සැලකිය යුතු කාර්යභාරයක් හා වගකීම් රැසක් ඉටු කරති. කෙසේ වෙතත්, ආහාර පද්ධති සඳහා කාන්තාවන්ගේ දායකත්වයන්ට බොහෝ විට නිල පිළිගැනීමක් අහිමි වන අතර, එහි දී සාධාරණ කොන්දේසි මත කටයුතු කිරීම වලක්වන බාධක වලට ඔවුහු බොහෝ විට මුහුණ දෙති.**

**කාන්තාවන් ද ඇතුළත් කරගනිමින් ආහාර පද්ධති පරිවර්තනයකට ලක් කිරීම සඳහා කාන්තාවන්ට සහභාගී වීමට හා සමාන ව ප්‍රතිලාභ ලැබීමට හැකිවන ප්‍රවේශයන් පමණක් නොව, උපායමාර්ගික ජීවන තෝරා ගැනීම් සඳහා කාන්තාවන් සවිබල ගැන්වීම ද අවශ්‍ය වේ. කාන්තාවන් ඇතුළත් කරගත් ආහාර පද්ධති තුළින් කාන්තාවන් පමණක් නොව ඔවුන්ගේ පවුල් හා පොදුවේ සමාජය ද ප්‍රතිලාභ ලබනු ඇත්තේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව හා ආහාරයේ ගුණාත්මකභාවය ද වැඩි දියුණු කරමිනි *(IFPRI, 2020).***

ලාභයට වඩා ගොවීන්ගේ, පාරිභෝගිකයින්ගේ සහ සොබාදහමේ අයිතීන්ට ප්‍රමුඛතාව ලබාදෙන පද්ධතියක් ලෙස අපේ ආහාර පද්ධතිය මුළුමනින් ම පරිවර්තනය කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු. පරිවර්තනය කරන ලද පද්ධතිය තුළ දී සියලුදෙනාගේ ම ආහාර ස්වෛරීභාවය සහතික කළ යුතු අතර, අපගේ පාරිසරික පද්ධතිවල පුනර්ජනනීය හැකියාවන් නැවත ගොඩනැගිය යුතු ය.

මෙම වාර්තාව ආහාර පද්ධති පරිවර්තනයන් හි ලා සමාජ - ආර්ථික, දේශපාලන හා පාරිසරික පැතිකඩ ඇති බව පිළිගන්නා අතර ම තිරසර ආහාර පද්ධති ගොඩනැගීමේ දී ස්ත්‍රී-පුරුෂ සමාජභාවී සාධාරණත්වය අත්‍යවශ්‍ය අංගයක් වන්නේයැයි තර්ක කරයි. ආහාර සඳහා ප්‍රවේශය සහ එහි නිෂ්පාදනය හා පරිභෝජනය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අසමානත්ව මත ගොඩනැගී ඇත්නම් ආහාර පද්ධති අසාර්ථක වීම නොවැළැක්විය හැකි අතර එවැනි ආහාර පද්ධති තිරසර නොවන බවට ද දැනටමත් ඔප්පු වී හමාර ය.

ලෝකයේ වඩාත් ම කුසගින්නෙන් පෙළෙන ජනයා සිටින්නේ සම්පත් වෙත ප්‍රවේශය ලබා ගැනීමට හා ඒවා පාලනය කිරීමට බාධා පමුනුවන ස්ත්‍රී-පුරුෂ සමාජභාවී වෙනස්කොට සැලකීම් විසින් කාන්තාවන් ආන්තික කරනු ලැබ සමාජයන්හී ය. මෙම සංසිද්ධිය සඳහා මූලික පදනම වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ ආහාර පද්ධති එකිනෙකට සම්බන්ධ ව පැවතීමයි (IPS, 2020).

ගෝලීය වශයෙන් ගත් කළ, ගොවි කාන්තාවන්ගේ ඵලදායිතාව ඔවුන්ගේ පිරිමි සගයන්ට සාපේක්ෂ ව සැලකිය යුතු ලෙස අඩු වන අතර එමගින් 20-30% අතර ප්‍රමාණයක ස්ත්‍රී පුරුෂ සමාජභාවී අස්වනු පරතරයක් නිර්මාණය වී ඇත. මෙම පරතරය පිටුපස පවත්නා බලවේගයන්ට ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කළහොත් මිලියන 36 ක ජනතාවක් කුසගින්නෙන් මුදවාගත හැකි ය (IFAD, 2014).

ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය තුළ කාන්තාවන්ගෙන් ප්‍රතිශතය 34.3% ක් පමණි. රැකියාවේ නියුතු මෙම කාන්තාවන්ගෙන් 27.7% ක් පමණ සේවය කරන්නේ කෘෂිකාර්මික අංශයේ ය (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2020). ගොවි කාන්තාවන්ට සහ ග්‍රාමීය කාන්තාවන්ට කෘෂිකාර්මික නිෂ්පාදන සම්පත් වෙත සමාන ප්‍රවේශයක් ලබා දීමෙන් ඔවුන්ට තමන්ට මෙන්ම සහ ආහාර පද්ධතියට ද බලපාන ප්‍රතිපත්ති හා භාවිතයන් පිළිබඳ කතිකාවන් සමග අර්ථවත් ලෙස ගණුදෙනු කිරීමට හා ඒවාට බලපෑම් කිරීමට හැකියාව ලැබේ. ස්වකීය ප්‍රාදේශීය පරිසර පද්ධති හා ජෛව විවිධත්වය සමග වැඩියෙන් ගණුදෙනු කරන කාන්තාවන්ගේ ක්‍රියාකාරී දායකත්වය කෙරෙහි ආහාර නිෂ්පාදනයේ දී අවධානය යොමු කිරීමට හා පිළිගැනීමට අපොහොසත් වීම ප්‍රජා මෙන්ම ජාතික මට්ටමේ ද තිරසර සංවර්ධනයට බාධා ඇති කරයි.

දේශගුණික විසඳුම් වලට නායකත්වය දීමට, ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කොට සැලකීමේ බාධකවලට පිටුපාමින් සහ අඛණ්ඩ ව ලෝකය පෝෂණය කිරීමට ගොවි කාන්තාවන්ට ඇති හැකියාව රජයන් හා සංවර්ධන නියෝජිතායතන විසින් බෙහෙවින් දුබල කරනු ලැබ ඇත. ආහාර පද්ධතියට කාන්තාවන්ගේ දායකත්වය ආර්ථික වර්ධන ප්‍රතිපත්ති තුළ ග්‍රහණය කර නොගන්නේ එවා ඵලදායි වැඩ ලෙස නොසැලකෙන බැවිනි. සෑම පුරුෂෝත්තමවාදී ධනේශ්වර ආර්ථිකයක ම පාහේ, නිවස තුළ සහ ඉන් පිටත කාන්තාවන්ගේ කාර්යභාරය නිර්වචනය කිරීමට ආර්ථික විද්‍යාඥයින්ට අසීරු වී ඇති අතර ආහාර පද්ධති සම්බන්ධයෙන් ගත් කළ ඒවා මේ ප්‍රවර්ග දෙක ම යටතට වැටෙයි (ගෝර්ඩන්, 2009).

ගෝලීයකරණය කෙරෙහි එල්ල වන දැඩි විවේචනයක් නම් එය විසින් ආහාර හා බීජවල අනන්‍යතාව සහ හිමිකාරිත්වය ලාභය අරමුණු කරගත් සමාගම් වෙත මාරු කර ඇති බවයි. ආහාර පිළිබඳ අදහස පෝෂණයේ ප්‍රභවයක සිට ලාභය උපරිම කිරීම සඳහා හැසිරවිය හැකි වෙළෙඳ භාණ්ඩයක් දක්වා ඌනනය වී ඇත (ශිවා, 2009).

ආහාර පද්ධති නැවතත් තිරසර හා සාධාරණ බවට පත්කිරීමට නම් සුළු ආහාර නිෂ්පාදකයින් එහා එහි දී මූලික වශයෙන් ගොවි කාන්තාවන්ගේ භූමිකාව තීරණාත්මක වේ. කෙසේ වෙතත්, මෙම භූමිකාව ඉටු කිරීමට නම්, ඔවුන්ට නිවැරදි අවස්ථා, මෙවලම් සහ සම්පත් සඳහා ප්‍රවේශය ලබා දිය යුතු ය.



# 02

# බිම් මට්ටමේ සාක්ෂි:

## ගොවීන් මුහුණ දෙන ප්‍රධාන බාධක

අදහස් විමසීමේ සැසිවල දී අනාවරණය වූ කරුණු අනුව මෙම වාර්තාව මඟින් ශ්‍රී ලංකාවේ ගොවි කාන්තාවන් මුහුණ දෙන අභියෝග ප්‍රධාන අංශ පහක් යටතේ වර්ගීකරණය කරයි.

### 2.1 ස්වාභාවික සම්පත් වෙත ප්‍රවේශය සහ පාලනය

සංවර්ධනය වෙමින් පවතින රටවල ආහාර වලින් 60-80% ක් නිෂ්පාදනය කිරීමේ වගකීම ගොවි කාන්තාවන් සතු වන නමුත් ඔවුන් හිමිකාරත්වය දරන්නේ ඉඩම් වලින් 2% ක් පමණි (ඔක්ස්ෆෑම්, 2010).

කෘෂිකර්මාන්තය තුළ, විශේෂයෙන් ස්වාභාවික සම්පත් වෙත ප්‍රවේශයට හා පාලනයට අදාළ ව ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතා ඉතා විශාල ය. ශ්‍රී ලංකාවේ ඉඩම් නොමැතිකම හෝ ඉඩම් වෙත ප්‍රවේශය නොමැතිකම හේතුවෙන් කාන්තාවන් කෘෂිකර්මාන්තයට සහභාගී වීම වැලැක්වීම පමණක් නොව, වටිනාකම් දාමයන් හී නුපුහුණු ශ්‍රමිකයින් සහ ප්‍රාථමික නිෂ්පාදකයින් වශයෙන් වන ඔවුන්ගේ භූමිකාව බොහෝ සීමාකාරීත්වයන්ට කොටු කරයි. ගොවියෙකු ලෙස පිළිගැනීමට ලක්වීම සඳහා වන ප්‍රධාන සාධකය වන්නේ ඉඩම් අයිතිය යි.

ඉඩම් හිමිකම් අහිමිවීම හේතුවෙන් ප්‍රතිපත්ති හා භාවිතාවන් හි දී ගොවි කාන්තාවන් බැහැර කරනු ලැබීම හේතු කොටගෙන ජලය, මූල්‍ය සේවා, වෙළෙඳපොළ සහ ව්‍යාප්ති සේවා ඇතුළු දේ වෙත වන ප්‍රවේශය සම්බන්ධයෙන් අතිමහත් බාධකයන්ට මුහුණ දීමට ඔවුන් ට සිදු වී ඇත.

ඉඩම් හිමිකම අහිමි තත්ත්වයක් තුළ පවා, කාන්තාවන් කෘෂිකාර්මික කටයුතුවල නිරත වන නමුත් එය බොහෝ දුරට යැපුම් ගොවිතැනට හෝ ගොවි බිම්වල දෛනික ව වැටුප් ලබන කුලී ශ්‍රමික භූමිකාව ට සීමා වී ඇත. ඉහත කී ක්‍රියාකාරකම් තුළින් ලැබෙන ආදායම බෙහෙවින් පහළ අගයක් ගන්නා අතර ම ඒවා බොහෝ විට සෘතුමය හා අස්ථාවර වේ.

ඉඩම් හිමිකාරිත්වයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතාවන්ට හේතු වී ඇත්තේ දැනට පවතින යල්පැනගිය වෙනස් කොට සැලකීමේ ඉඩම් නීති සහ රෙගුලාසි ය. ඉඩම් අයිතිවාසිකම්වල අසමානතා සාම්ප්‍රදායික නීති මෙන්ම ඉඩම් සංවර්ධන ආඥාපනත තුළ ද පැහැදිලි ව හඳුනාගත හැකි ය. ඉඩම් සංවර්ධන ආඥා පනතේ තුන්වන උපලේඛනය මඟින් කාන්තා උරුමක්කරුවකු අභිබවා පිරිමි උරුමක්කරුවන්ට ප්‍රමුඛත්වය ලබා දේ. පුරුෂයින්ට, විශේෂයෙන් පවුලක බාල ම පිරිමි දරුවාට වාසිදායක ලෙස අනුප්‍රාප්ති උරුමය හිමිකර දීම ග්‍රාමීය කාන්තාවන්ගේ ඉඩම් අයිතියට ඇති ප්‍රධාන ත ම බාධාව ලෙස සැලකිය හැකි ය. එසේ ම උඩරට නීතිය, තේසවලමේ නීතිය සහ මුස්ලිම් නීතිය තුළ ඉඩම් හිමිකම් හා භුක්තිය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ හා පාලනය කිරීමේ බලය පිරිමින්ට හිමිකරදෙන ප්‍රතිපාදන අන්තර්ගත ය. නාගරික ප්‍රදේශවල මෙම සංසිද්ධිය දුලබ වුවද, ඉහත කී සාම්ප්‍රදායික නීති වලින් දැඩි ව බැඳී සිටින ග්‍රාමීය ගොවි ප්‍රජාවන් තුළ ගොවි කාන්තාවෝ මෙම නෛතික ප්‍රතිපාදනයන්ගෙන් පීඩා විඳිති.

බොහෝ විට බැංකු ණය දෙන විට ඉඩම් ඇපයක් තැබීම අවශ්‍ය වේ. විධිමත් ණය යෝජනා ක්‍රම සහ මූල්‍ය සේවාවන් නොමැති ව කාන්තා ගොවීහු අසරණ වෙති. ඉඩම් හිමිකමක් නොමැතිකම නිසා නොවැලැක්විය හැකි ලෙස ම රටේ ගොවි කාන්තාවන් නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වලින් ඉහළ පොලී මත ණය ලබා ගැනීමේ අවදානමට ගොදුරු වෙති.

"ඉඩම් අයිතිය බොහෝ විට පුරුෂ කේන්ද්‍රීය ලෙස සැලකේ. ගෘහ මූලිකයාගේ නමින් ඉඩම් ලබාදෙනු ලැබේ. බොහෝවිට ගෘහ මූලිකයින් ලෙස සැලකෙන්නේ පිරිමි ය."

- මෙය මූලික වශයෙන් රටේ යුද ගැටුම් පැවැති උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ගොවි කාන්තාවන් සමඟ පැවැති සාකච්ඡා සැසිවල දී නැවත නැවත ප්‍රකාශ වූ කරුණකි.

ඉඩම් අයිතිය අහිමිවීම විසින් ඊට අනුපූරක ව පැමිණෙන තවත් බලපෑම් රැසක් ද ශ්‍රී ලංකාවේ ගොවි කාන්තාවක් වෙත උරුම කරදෙයි. ඉඩම් අයිතිය නොමැති නම්, රජය විසින් පවත්වාගෙන යන ගොවිජන සේවා මධ්‍යස්ථානවල ලියාපදිංචි වීමට නොහැක. ඉඩම් හිමිකම රාජ්‍ය කෘෂි යාන්ත්‍රණය තුළ ලියාපදිංචි වීම, ව්‍යාප්ති සේවා, වෙළෙඳපොළ තොරතුරු, පුහුණුව, සහනාධාර හා ගොවි සංවිධානවල සාමාජිකත්වය සඳහා- ද පූර්වාවශ්‍යතාවක් ලෙස ක්‍රියා කරයි. වැව් කමිටු සාමාජිකත්වය හිමිවන්නේ ද ඉඩම් හිමි ගොවීන්ට පමණි. එබැවින් ඉඩම් නොමැති ග්‍රාමීය ගොවි කාන්තාවන්ට රජය මඟින් කෘෂිකාර්මික කටයුතු සඳහා ලබා දෙන වාරි යෝජනා ක්‍රම සඳහා ප්‍රවේශය අහිමි වී යයි (FAO, 2018). ගොවි සංවිධාන හා වැව් කමිටුවල සාමාජිකත්ව

අහිමි වීමෙන් ගොවි කාන්තාවන්ට තම ගැටලු පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාවක් නොමැතිවනවා මෙන්ම සමස්තයක් ලෙස ගොවියා යන අනන්‍යතාව සහ පිළිගැනීම ද අහිමි වී යයි.

බොහෝ දුරට නොසලකා හරිනු ලැබ ඇති තත්ත්වය ක දී පවා ලොව පුරා ම ස්වදේශික බීජ ප්‍රභේද සහ සාම්ප්‍රදායික ගොවිතැන් පිළිවෙත්වල භාරකරුවන් ලෙස කටයුතු කරන්නේ ගොවි කාන්තාවන් ය.

තමන්ගේ ම ප්‍රජාවන්ගේ සිට බහුජාතික සමාගම් දක්වා විවිධ මට්ටම් විසින් අභිමුඛ කරනු ලැබ ඇති බාධක මධ්‍යයේ පවා කාන්තා ගොවීහු පරම්පරා ගණනාවක් තිස්සේ තමන් විසින් සිදුකරගෙන ආ ගෞරවනීය කාර්යභාරයක් වන තම දේශීය බීජ ප්‍රභේද ආරක්ෂා කරගනිමින් දේශීය ආහාර පද්ධති තිරසර ව පවත්වා ගැනීම සඳහා ඉමහත් පරිශ්‍රමයක නිරත ව සිටිති. අදහස් විමසීමේ සැසිවලදී ගොවි කාන්තාවන් වෙතින් ප්‍රකාශ වූ පරිදි, බීජ අයිතිය සමාගම් සතු කිරීම තුළින් දේශීය බීජ ප්‍රභේද සංරක්ෂණය කිරීමේ හා බෙදාගැනීමේ කාන්තාවන්ගේ අයිතිවාසිකමත්, ජෛව විවිධත්වයේ භාරකරුවන් වශයෙන් කාන්තාවන් විසින් ඉටු කළ කාර්යභාරයත් ඔවුන්ට අහිමි කොට ඇත.

## 2.2 වෙළෙඳපොළ වෙත ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනයෙන් 34.3% ක් කාන්තාවෝ වෙති. මෙම රැකියා කරන කාන්තාවන්ගෙන් දළ වශයෙන් 27.7% ක් කෘෂිකාර්මික අංශයේ සේවය කරයි (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2020). මේ කාන්තාවන්ගෙන් වැඩිදෙනෙක් යැපුම් ගොවිතැනේ නියැලෙන අතර කෘෂිකර්මාන්තයේ වාණිජ මට්ටම් වලට පිවිසීමට සහ වටිනාකම් දාමයන් හී ඉහළ මට්ටම් වෙත ළඟා වීමේ දී හා සමස්තයක් ලෙස වෙළෙඳපොළ වෙත ප්‍රවේශය ලබා ගැනීමේ දී බාධක රැසකට මුහුණ දෙති.

අදහස් විමසීමේ සැසිවල දී ඉස්මතු වූ පරිදි, සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන් පිළිබඳ සමාජ සම්මතයන් හී පැවැත්ම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස්කොට සැලකීමේ ප්‍රතිපත්ති හා භාවිතාවන් හේතුවෙන් ගොවි කාන්තාවකට වෙළෙඳාමේ නිරත වීමට සහ වෙළෙඳපොළ ආර්ථිකය තුළ ස්වකීය පැවැත්ම තහවුරු කරගැනීමට බාධාකාරී ලෙස ක්‍රියාත්මක වේ. කාන්තාවක් භෞතික ව වෙළෙඳපොළට පැමිණීම සහ අලෙවිකරණ විකල්පයන් තක්සේරු කිරීමේ දී ප්‍රධාන තීරණාත්මක සාධකය ලෙස සංචලනය පිළිබඳ ගැටලුව හඳුනාගෙන ඇත. ගොවි කාන්තාවකගේ සංචලන මට්ටම සීමා කිරීමට ප්‍රධාන හේතුවක් නම් ගෙදර දොරේ වැඩ කටයුතු වැනි ඇගේ රැකවරණ වගකීම් ය. නිසි ප්‍රවාහන පහසුකම් සහ යටිතල පහසුකම් නොමැතිකම ද ගොවි කාන්තාවන්ට වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමේ දී සහ ගොවි සංවිධාන හා සමූපකාර හා සම්බන්ධ වීමේ දී බාධාකාරී ලෙස ක්‍රියාත්මක වේ. ඉහත සඳහන් කළ ආකාරයේ කාන්තා නිෂ්පාදක කණ්ඩායම් සමඟ සම්බන්ධතාවක් නොමැති වීම විසින් ද වෙළෙඳපොළ ඉල්ලුම, වෙළෙඳපොළ අවස්ථා සහ වාණිජමය කටයුතු සඳහා ඇති ඉඩ ප්‍රස්ථා පිළිබඳ තොරතුරු ලබා ගැනීම තවදුරටත් සීමා කරයි.

මධ්‍යම පළාතේ, නුවරඑළියේ කාන්තා ගොවීහු, වෙළෙඳපොළ ට ප්‍රවේශ වීමේ දී තමන් මුහුණපාන ප්‍රධාන අභියෝගය පිළිබඳ පැහැදිලි ව ම අදහස් ප්‍රකාශ කළහ -"අලෙවිකරණ ක්‍රියාවලියේ දී කාන්තාවන් දැඩි අපහසුතාවට පත් වෙනවා. බොහෝ විට වෙළෙඳපොළ තුළ අපේ නිෂ්පාදන විකුණන්නේ පිරිමි. යම් විදිහකින් ප්‍රධාන වෙළෙඳපොළ ට කාන්තාවන් ගියත්, එහි දී මිල ගණන් සාකච්ඡා කිරීමේ දී කාන්තාවන්ට අභියෝග රැසකට මුහුණ දීමට සිදු වෙනවා."

සිය ගොවිතැන යැපුම් මට්ටමක සිට වාණිජමය නිෂ්පාදන මට්ටම දක්වා ඉහළ නැංවීමටත්, ඊට සමාන්තරව වටිනාකම් දාමයන් හී ඉහළ ට යාමටත් අවශ්‍ය වන්නා වූ වෙළෙඳපොළ සබඳතා සහ මූල්‍ය සම්පත් සාපේක්ෂ වශයෙන් ගොවි කාන්තාවන් ට අහිමි ය. සමස්ත වෙළෙඳපොළ ආර්ථිකය තුළ වෙළෙඳපොළ තොරතුරු ලැබීම, වෙළෙඳපොළ හඳුනා ගැනීම, තීරණ ගැනීම, කේවල් කිරීම සහ සාකච්ඡා කිරීම පිරිමින්ගේ කාර්යයන් ලෙස සැලකේ. තව ද, ප්‍රාථමික නිෂ්පාදකයෙකු වීමේ සිට වටිනාකම් දාමයේ ඉහළ තලයකට ළඟා වීමට අවශ්‍ය වන්නා වූ විශේෂිත වෙළෙඳපොළ සහතික කිරීම් වලට අදාළ තොරතුරු හා සේවාවන් වෙත ප්‍රවේශය ගොවි කාන්තාවන් ට හිමිවන්නේ කලාතුරකිනි.

## 2.3 මූල්‍ය සේවා වෙත ප්‍රවේශය

යැපුම් ගොවිතැනින් ගොවි කාන්තාවන් වාණිජමය මට්ටමේ කෘෂිකර්මාන්තයට යාම වැලැක්වීමේ ප්‍රධාන බාධාවක් ලෙස මූල්‍ය සේවාවන්ට ප්‍රවේශය නොමැති වීම හඳුනාගෙන ඇත. ග්‍රාමීය කාන්තාවන්ට, විශේෂයෙන් ගොවි කාන්තාවන්ට ණය පහසුකම්, මූල්‍ය ප්‍රාග්ධනය සහ ඉතිරි කිරීමේ යාන්ත්‍රණයන් ලබා ගැනීම සඳහා වන නියාමනය කළ මූල්‍ය සේවාවන් අතිශයින් දුලබ ය.

නමුත්, නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රජාවන් තුළ අතිශය සක්‍රීය ලෙස ක්‍රියාත්මක වන අතර ග්‍රාමීය කාන්තාවන් පසුවන අසීරු තත්ත්වයන් තමන්ගේ වාසියට හරවාගනිමින් ඔවුන් සූරාකෑම සම්බන්ධයෙන් මෙම සමාගම් වෙත නිරන්තර විවේචනයන් එල්ල වේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 45% කට වඩා පිරිසකගේ දෛනික ආදායම ඇමරිකානු ඩොලර් 5 ට අඩු ය (ලෝක බැංකුව, 2017). බොහෝ විට මෙම කණ්ඩායමට වැටෙන ග්‍රාමීය ගොවි කාන්තාවන්ට මූලික හේතු දෙකක් නිසා බැංකු වලින් සේවා ලබා ගැනීම කළ නොහැකි ය. එනම් බැංකු ණය සඳහා තැබිය හැකි සුරක්ෂිතයක් ඔවුන් සතු නොවීමත්, ණය වෙනුවෙන් ඇපකරුවන් ඉදිරිපත් කිරීමට ඔවුන් අපොහොසත් වීමත් ය. බොහෝ විට ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් මඟින් සතිපතා ණය වාරික එකතු කෙරේ. වර්තමාන දේශීය සන්දර්භය තුළ, ගොවි කාන්තාවන් දැනටමත් වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීම ඇතුළු විවිධ බාධක වලට මුහුණ දී සිටින අතර, මෙසේ සතිපතා ණය වාරික ගෙවීමට සිදුවීම තුළින් සිදුවන්නේ ඇයගේ මූල්‍ය හැකියාව තවදුරටත් පිරිහීම පමණි.

යම්හෙයකින් කාන්තා ගොවියෙකුට ණයක් ගෙවීමට නොහැකි වුවහොත්, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සාමාන්‍යයෙන් කරන්නේ ණය වාරික ගෙවීම සඳහා තවත් ණය මුදලක් ලබාගැනීමට ඇය පෙළඹවීමයි. මෙයින් සිදුවන්නේ මිදිය නොහැකි ණය උගුලකට ඇය ඇද වැටීමයි. තව ද, ණය ආපසු ගෙවීමේ දී අතපසුවීම් සිදු වන අවස්ථාවලදී ණය එකතු කරන්නන් කාන්තාවන්ට විවිධ වාචික, ශාරීරික හා ලිංගික හිංසනයන්ට ලක් කරන බවට ද වාර්තා පල ව ඇත.

ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල මෙම ක්‍රියාත්මක ව්‍යුහය විසින් ඵලදායි කෘෂිකාර්මික ශ්‍රමය සඳහා කාන්තාවකට ඇති හැකියාව තවදුරටත් අඩපණ කරයි. ඉහළ පොලී අනුපාත සහිත ණය ගෙවීම සඳහා කාන්තාවන් කෘෂිකර්මාන්තයෙන් මුළුමනින් ම ඉවත් වී විවිධ ආකාරයේ දෛනික වැටුප් ලබන රැකියාවල නිරත වූ අවස්ථා බිම් මට්ටමේ පර්යේෂණ මඟින් අනාවරණය වී ඇත.

ගොවි කාන්තාවන් ණය ලබාගැනීමේ දී අත්සන් කරන ලියකියවිලි බොහෝවිට ඉංගීසි භාෂාවෙන් සකස්කොට ඇති බැවින් ඒවායේ අන්තර්ගතය පිළිබඳ ඔවුන් ට වැටහීමක් නොමැත. බැංකුවකින් මෙම සේවාවන් ලබා ගැනීමේ විකල්පය බොහෝ විට ඔවුන් විසින් නොසලකා හරින්නේ බැංකුවලට සුරක්ෂිත සහ ඇපකරුවන් ඉදිරිපත් කළ යුතු වීමත්, ණය ලබාදීමේ ක්‍රියාවලියට වැඩි කාලයක් ගත වීමත්, ණය අනුමත කිරීම අයදුම්කරුගේ ආපසු ගෙවීමේ හැකියාව මත රඳා පැවතීමත් හේතුකොටගෙන ය. දැනටමත් ආර්ථික හා සමාජීය වශයෙන් විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින ගොවි කාන්තාවන්ට මෙම නිර්ණායක තෘප්ත කිරීමේ හැකියාවක් නොමැත. ණය යෝජනා ක්‍රම සහ මූල්‍ය සේවා විකල්පයන් පිළිබඳ නොදැනුවත්භාවය, ප්‍රමාණවත් සුරක්ෂිතයක් ඉදිරිපත් කිරීමේ හෝ ඇපකරුවන් සොයාගැනීමේ නොහැකියාව සහ ආදායමේ අස්ථාවරභාවය හේතුකොටගෙන ගොවි කාන්තාවන්ට විශ්වාසදායක මූල්‍ය සේවාවන් ලබා ගැනීමේ අවස්ථාව අහිමි ව යයි. එය කාන්තාවන් වාණිජ කෘෂිකර්මාන්තයට සක්‍රීය ව සම්බන්ධ වීම සහ වෙළෙඳපොළ පද්ධති සමග සම්බන්ධ වීම කෙරෙහි ද ඍණාත්මක බලපෑමක් ඇති කරයි.

## 2.4 තාක්ෂණය වෙත ප්‍රවේශය

ගෝලීය වශයෙන් ගත් කළ, ගොවි කාන්තාවන්ගේ ඵලදායිතාව ඔවුන්ගේ පිරිමි සගයන්ට සාපේක්ෂ ව සැලකිය යුතු ලෙස අඩු අගයක් ගනී. මේ අනුව අස්වැන්න අතින් ගත් කළ 20-30% ක පමණ ස්ත්‍රී පුරුෂ සමාජ භාවී වෙනසක් හඳුනාගත හැකි ය. මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවී පිටුපස ඇති ප්‍රධාන හේතූන් ට නිසි ලෙස ආමන්ත්‍රණය කළ හොත් මිලියන 36 ක ජනතාවක් කුසගින්නෙන් මුදවාලිය හැකිය (IFAD, 2014). ගොවි කාන්තාවන්ට තාක්ෂණය වෙත ප්‍රවේශයක් අහිමි වීම කෘෂිකාර්මික ඵලදායිතාව සඳහා ඇයගේ ශ්‍රමය ප්‍රශස්ත ලෙස භාවිත කිරීමට බාධා කරන ප්‍රධාන සාධකයක් ලෙස සැලකෙයි.

වෙනස්කොට සලකන ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමාජ සම්මතයන් හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ගොවි කාන්තාවන් අතර තාක්ෂණික දැනුම සහ මෙවලම් ව්‍යාප්තියේ පැහැදිලි අසාධාරණයක් පවතී. විවිධ පුවත් හා ක්ෂේත්‍ර මට්ටම් සොයා ගැනීම් වලින් පෙන්නුම් කරන්නේ ගොවි කාන්තාවන්ට ගොවි උපකරණ වෙත ප්‍රවේශය හිමිවන්නේ කලාතුරකින් බවත්, පිරිමි ගොවීන් හා සසඳන විට ඔවුන් සතු වන්නේ මෙවලම් සුළු ප්‍රමාණයක් බවත් ය. මේ හේතුකොටගෙන රටේ කාන්තා කෘෂිකාර්මික ශ්‍රම බලකායට මූලික වශයෙන් නුපුහුණු ශ්‍රමයේ නියුක්ත වීමට සිදු වී ඇති අතර, බොහෝ විට විශාල වශයෙන් කාලය හා ශ්‍රමය වැය වන කාර්යයන් හී නිරත වෙමින් ප්‍රාථමික නිෂ්පාදකයින් වශයෙන් ආහාර වටිනාකම් දාමයේ බෙහෙවින් පහළ මට්ටමක රැඳී සිටීමට සිදු ව ඇත.

විශේෂයෙන් ගොවි කාන්තාවන්ට ආධාර කිරීම පිණිස සැලසුම් කර ඇති කෘෂිකර්ම ව්‍යාප්ති සේවාවන් ද සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන්ගෙන් හා වෙලී ඇත. ගොවි කාන්තාවන්ට පුහුණුව ලබාදෙනු ලබන්නේ පවුලේ පෝෂණය, ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව සහ කාන්තා ගොවි සංවිධාන පිහිටුවීම යනාදිය සම්බන්ධ විෂය කරුණු පිළිබඳ ව ය (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2014). ගොවිජන සේවා මධ්‍යස්ථාන යටතේ ලියාපදිංචි වී සිටින ගොවි කාන්තාවන්ට තාක්ෂණික දැනුම හා පුහුණුව ලබා ගැනීමේ අවස්ථාව ඇත. කෙසේ වෙතත්, ඉඩම් හිමිකාරත්වය දැරීම, ගොවිජන සේවා මධ්‍යස්ථානවල ලියාපදිංචි වීම සඳහා පූර්වාවශ්‍යතාවක් වන බැවින් ගොවි කාන්තාවන්ගෙන් බහුතරයකට එකී සුදුසුකම සපුරාලිය නොහැකි වේ. මෙමගින් ගොවි කාන්තාවන්ගේ තාක්ෂණික ශක්‍යතාව වර්ධනය කරගැනීමේ අවස්ථා තවදුරටත් සීමා සහිත කරවයි.

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින අනුරාධපුරයේ ගොවිපොළ යාන්ත්‍රිකකරණ පුහුණු මධ්‍යස්ථානය සහ පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් නිකුත් කරන ලද වාර්තා වලට අනුව 2015 සිට 2018 දක්වා කාලය තුළ ඒවායේ පුහුණුව ලැබූ ගොවීන්ගෙන් කාන්තා ප්‍රතිශතය 10% කටත් වඩා අඩු ය (FAO, 2018). තාක්ෂණය වෙත ප්‍රවේශය නොමැති වීම නිසා ගොවි කාන්තාවකට ඵලදායිතාව ඉහළ නැංවීමට, වෙළෙඳපොළ ට විධිමත් ප්‍රවේශයක් ලබා ගැනීමට, වටිනාකම් දාමයන්ට ඵලදායි ලෙස සහභාගී වීමට සහ සමස්ත පාඩු අවම කර ගැනීමට නොහැකි වී ඇත.

## 2.5 රැකවරණ වගකීම්

ශ්‍රී ලංකාව තුල සෑම වයස් මට්ටමකම පිරිමින්ට වඩා කාන්තාවන්ගේ රැකියා වියුක්ති අනුපාතය දෙගුණයකටත් වඩා වැඩි වන අතර, විශේෂයෙන් කෘෂිකර්මාන්තය තුළ ආර්ථික වශයෙන් සක්‍රීය කාන්තාවන් අතිබහුතරයක් වැටුප් නොලබන පවුලේ ශ්‍රමය තුළ සංකේන්ද්‍රණයව සිටිති (ආසියානු සංවර්ධන බැංකුව, 2015). ඵලදායි හා ප්‍රජනන වගකීම් යන දෙක ම සැලකිල්ලට ගත් විට ග්‍රාමීය කාන්තාවන්, විශේෂයෙන්ම කාන්තා ගොවීහු, ඔවුන්ගේ පිරිමි සගයන්ට සාපේක්ෂ ව දිනකට වැඩිපුර පැය ගණනක් වැඩ කරති.

කෘෂිකාර්මික අංශය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතා ඉතා පැහැදිලි ව පෙනෙන නමුත් ඒවා සංඛ්‍යාත්මක ව ගණනය කිරීම අසීරු ය. වැටුප් රහිත රැකවරණ සහ ගෙදරදොර වැඩ යන දෙකෙහි ම නියැලී සිටින, එමෙන් ම යැපුම් ගොවිතැන තුළ ද බොහෝවිට වැටුප් නොලබා ශ්‍රමය සපයන කාන්තාවන්ගේ දායකත්වය ග්‍රාමීය ආර්ථිකය තුළ නිසි ඇගයීමට ලක් නොවේ (ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2018).

වැටුප් රහිත රැකවරණ වගකීම් සඳහා පිළිගැනීමක් ලබාදිය යුතු බව අවධාරණය කළ මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල කාන්තාවන් කියා සිටියේ "ගෙදර දොරේ වැඩ සහ කෘෂිකාර්මික කටයුතු සඳහා කාන්තාවන් උදවු කරනවා. දිනෙන් දින වැඩි වන ගෙදර දොර වැඩ නිසා කාන්තාවන්ගේ ආර්ථික දියුණුවට විවිධ බලපෑම් එල්ල වෙනවා. එනිසා මෙම කාරණා සම්බන්ධයෙන් පවුල් හා ප්‍රජා මට්ටම් වල වෙනස්කම් සිදු කළ යුතුයි" යනුවෙනි.

කාන්තාවන් වෙතින් නිරන්තරයෙන් අපේක්ෂා කරනු ලබන සමාජ වගකීම් හේතුකොටගෙන ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කාන්තාවන්ට, විශේෂයෙන් ගොවි කාන්තාවන්ට හිමි අවස්ථා බෙහෙවින් සීමා සහිත වී ඇත. කෘෂිකර්මාන්තයේ කාන්තා නියෝජනය අඛණ්ඩ ව අවතක්සේරු කොට ඇත. යැපුම් ගොවිතැනේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළත්, පැළ සිටුවීම, වල් නෙලීම, අස්වනු නෙලීම යනාදී වශයෙන් කෘෂිකාර්මික භූමිකාවන් රැසක නිරත වූවත් කාත්තාවන් සහ ඔවුන්ගේ සමීපතම ප්‍රජාවන් විසින් ම තමන් ගොවීන් ලෙස නාමකරණය කරගැනීමෙන් වැලකී සිටිති.




# 03
# ප්‍රතිපත්ති හිඩැස් සහ නිර්දේශ

ජාතික කෘෂිකාර්මික, ආර්ථික හා ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති තුළ ස්ත්‍රී පුරුෂ භාවය මූලප්‍රවාහගත කිරීම අත්‍යවශ්‍ය වේ. ගොවි කාන්තාවන්ගේ ප්‍රයෝජනයට නොගත් විභවතාවන් සහ රටේ බිඳුණු ආහාර පද්ධතිය යළි සකස් කිරීමේ අනිවාර්ය අංගයක් ලෙස ඔවුන් හඳුනා ගැනීමේ වැදගත්කම පිළිබඳ ව මහජන හා ප්‍රතිපත්තිමය කතිකාවක් නිර්මාණය කළ යුතු ය. ශ්‍රී ලංකාවේ ගොවි කාන්තාවන් මුහුණ දෙන ඉහත සාකච්ඡා කරන ලද බාධක මුලිනුපුටාදමනු වස් ප්‍රතිචාර දැක්වීම හා වඩාත් ඵලදායී ලෙස පියවර ගැනීම සඳහා විශේෂයෙන් ම ගොවි කාන්තාවන් හා සම්බන්ධ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ රජයේ නිලධාරීන්ගේ ශක්‍යතාවන් වැඩිදියුණු කළ යුතු ය.

පිරිමි ගොවීන් හා සමාන අවස්ථාවන් හා සම්පත් සඳහා ප්‍රවේශයක් ගොවි කාන්තාවන්ට ද ලබා දෙන්නේ නම් අවසානයේ සමස්ත ඵලදායිතාව විශාල වශයෙන් වර්ධනය කළ හැකි බවට සාක්ෂි ලෝකය පුරා ම ඕනෑ තරම් පවතී. කෘෂිකාර්මික අංශය සහ ආහාර නිෂ්පාදනය සඳහා ගොවි කාන්තාවන්ගේ දායකත්වය ප්‍රයෝජනයට නොගැනීම සහ අවතක්සේරු කිරීම හේතුවෙන් සිදුවන ඵලදායිතාව පහත වැටීම සහ ආදායම අහිමි වීම තක්සේරු කිරීම අවශ්‍ය වේ. ඉහත සඳහන් ගණනය කිරීමේ සංඛ්‍යාත්මක ප්‍රතිඵල විසින් ශ්‍රී ලංකාවේ ගොවීන් මුහුණ දෙන මෙම පත්‍රිකාවේ දක්වා ඇති ප්‍රධාන බාධක විසඳීම සඳහා වන දැඩි පියවර ගැනීමට ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදකයින්ට බලකර සිටිනු ඇත.

## නිර්දේශ

- පාරිසරික වශයෙන් යහපත් සහ තිරසර ක්‍රම ඔස්සේ නිෂ්පාදනය කරන සෞඛ්‍ය සම්පන්න හා සංස්කෘතිකමය වශයෙන් යෝග්‍ය ආහාර සඳහා ජනතාවට තිබෙන හිමිකම

- කුඩා පරිමාණ නිෂ්පාදකයින්ට තම ආහාර හා කෘෂිකාර්මික ක්‍රම සහ සමාගම්වල අවශ්‍යතාවලට වඩා නිෂ්පාදකයින්ගේ, පාරිභෝගිකයින්ගේ සහ සොබාදහමේ අවශ්‍යතාවන්ට ප්‍රමුඛතාව දෙන දේශපාලන ක්‍රමයක් සම්බන්ධයෙන් තීරණ ගැනීමට ඇති හිමිකම.

- ආහාර නිෂ්පාදන පද්ධතියක් තුළ කෘෂි පරිසර විද්‍යාව පදනම් කරගත් ප්‍රවේශයක් තහවුරු කෙරෙන සම්පූර්ණ පරිවර්තනයක් අපගේ ආහාර පද්ධතිය තුළ සහතික කිරීම

ස්වභාවික සම්පත් වෙත ප්‍රවේශය හා පාලනය සහ ඉඩම්, මූල්‍ය සේවාවන්, වෙළෙඳපොළ, තාක්ෂණය හා රැකවරණ කාර්යයන් නැවත බෙදාහැරීම සම්බන්ධ තීරණ ගැනීමේ දී ගොවි කාන්තාවන්ගේ භූමිකාව වර්ධනය කළහොත් අපගේ ආහාර පද්ධති ඉහත සඳහන් කළ ආකාරයේ පරිවර්තනයක් කරා මෙහෙයවීමට කාන්තාවන් සමත් වන ඇත.

ඉලක්කගත ප්‍රධාන නිර්දේශ මතු සඳහන් පරිදි වේ.

- විශේෂයෙන් කාන්තාවකගේ අයිතිවාසිකම් හා සම්පත් සඳහා ඇති ප්‍රවේශය සීමා කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කොට සැලකීම් පදනම් කරගත් නීති, ප්‍රතිපත්ති සහ නියාමන පරිචයන් සංශෝධනය කිරීම.

- කාන්තා නායකත්වය සහිත සමූපකාර සහ අනෙකුත් සාමූහික නිෂ්පාදන අලෙවිකරණ මුලපිරීම් සඳහා සහාය වීම.

- ගොවි කාන්තාවන්ට සාකච්ඡා කිරීමට හා තීරණ ගැනීමට ඉඩ සැලසෙන අවකාශයක් වෙළෙඳපොළ, දේශපාලන ක්ෂේත්‍රයන් හා සැපයුම් දාමයන් තුළ නිර්මාණය කිරීම.

- ගොවි කාන්තාවන්ගේ බීජ (සාම්ප්‍රදායික ප්‍රභේද ඇතුළු ව) භාවිත කිරීම, සංරක්ෂණය සහ හුවමාරු කිරීම සඳහා වන හිමිකම ආරක්ෂා කිරීම සහ ගොවීන්ගේ බීජ හිමිකම් උල්ලංඝනය වන කිසිදු ආකාරයක නෛතික ප්‍රතිපාදනයක් ඇති කිරීමෙන් වැළැක්වීම.

- කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන කෘෂි පාරිසරික ගොවිතැන, පර්යේෂණ සහ ව්‍යාප්ති සේවා සඳහා සහාය වීම.

- ගොවි කාන්තාවන්ගේ ධාරිතාව ගොඩනැංවීම සහ ඔවුන් ට බීජ සංරක්ෂණයට, පාරම්පරික දැනුම හුවමාරු කර ගැනීමට සහ සමුපකාර සමිති, වෙළෙඳපොළ සහ සමාජ ව්‍යාපාර තුළින් සාමූහික ක්‍රියාකාරකම් සඳහා හිතකර පරිසරයක් සකසා දීම.

- ගොවි කාන්තාවන්ගේ ව්‍යවසායකත්ව කුසලතා හැකියාවන් ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා මඟින් වැඩසටහන් සකස් කර සහයෝගය ලබා දීම.

- ගොවි කාන්තාවන්ගේ අවශ්‍යතා ඉලක්ක කරගනිමින් ප්‍රවාහන පහසුකම් සහ වෙළඳපොළ අවකාශයන් ඇතුළු යටිතල පහසුකම් සකස් කිරීම.

- ගොවි ප්‍රජාවන්, වෙළෙඳපොළ පද්ධතිය තුළ සිටින පාර්ශවකරුවන් සහ අනාගත ගැනුම්කරුවන් අතර ගොවි කාන්තාවන් නායිකාවන්, ව්‍යවසායිකාවන් සහ තීරණ ගන්නවුන් වශයෙන් නිරූපනය කිරීමේ ව්‍යාපාර ආරම්භ කිරීම.

- විශේෂයෙන් ම ගොවි කාන්තාවන් ඉලක්ක කරගනිමින් දිගු ආපසු ගෙවීමේ කාල සීමාවන් සහිත අඩු පොලී ණය යෝජනා ක්‍රම ඇති කිරීම.

- සියලුම කාර්මික දැනුම හා නිපුණතා පුහුණු වැඩසටහන් සඳහා ගොවි කාන්තාවන්ගේ සමාන සහභාගීත්ව අනිවාර්ය අවශ්‍යතාවක් ලෙස නියම කිරීම.

- පිරිමි කාර්යයන් සහ කාන්තා කර්තව්‍යයන් වශයෙන් සමාජ සම්මතයන් අනුමත නොකිරීම පිළිබඳ ව ගොවි ප්‍රජාවන් සහ කෘෂිකාර්මික උපදේශකයින් සංවේදී කිරීම.

- ගොවි කාන්තාවන් සඳහා පරිශීලක-හිතකාමී තාක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම.

- ගොවි කාන්තාවන් අතර රැකවරණ කටයුතු හඳුනා ගැනීම සහ ඒවා නැවත බෙදා හැරීම ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් රජයේ පාර්ශවකරුවන් හා සංවර්ධන ආයතන අතර ප්‍රතිපත්තිමය සංවාද ස්ථාපිත කිරීම.

**2.1 - 2.5 කොටස්වල දක්වා ඇති නිශ්චිත බාධක සඳහා වැඩිදුර නිර්දේශ ඇමිණුම 03 හි අන්තර්ගත වේ.**



# ඇමිණුම 01:
## අදහස් විමසීම් සැසිවල දී අනාවරණය වූ මූලික කරුණු

**මඩකලපුව දිස්ත්‍රික්කය**

- සාමාන්‍යයෙන් ගොවීන් ලෙස හඳුනාගනු ලබන්නේ පිරිමින් ය. ඊට හේතු වී ඇත්තේ බොහෝවිට ඉඩම් හිමිකාරිත්වය ලියාපදිංචි කරනු ලබන්නේ පිරිමින්ගේ නමින් වීමයි. සාමාන්‍යයෙන් කාන්තාවන් සැහැල්ලු කාර්යන් හී නිරතවන අතර පුරුෂයෝ බර වැඩ කරති (වල් පැළ ගැලවීම සහ කැම සෑදීම වැනි). පුරුෂයින් පවුලේ මූලිකයා ලෙස සැලකෙන නිසා, පවුලට ඉඩම් අයිතිය ලබාදීමේ දී එය පුරුෂයාට ලබාදෙනු ලැබේ.

- කෘෂිකාර්මික ක්‍රියාවල දී තීරණ ගැනීම පිරිමින් විසින් සිදුකරනු ලබයි. ඔවුන් ට කෘෂිකර්මාන්තය හා සම්බන්ධ වැඩිදුර දැනුම සහ අද්දැකීම් ඇත්තේ ඔවුන ට ය.

- මහා පරිමාණ කෘෂිකාර්මික ක්‍රියාකාරීත්වයන් පිරිමින් විසින් සිදුකරගෙන යන අතර, ගෙවතු කාන්තාවන් විසින් පවත්වාගෙන යනු ලබයි. මහා පරිමාණ කෘෂිකාර්මික ක්‍රියාකාරීත්වයන් සහ පසු-අස්වනු ක්‍රියාකාරීත්වයන් ද පුරුෂ කේන්ද්‍රීය වේ.

- දෙමළ කාන්තාවන් කුඹුරේ දී පිරිමින් සමග කෘෂිකාර්මික ක්‍රියාකාරීත්වයන් නියැලෙන අවස්ථා පැවතිය-ද, මුස්ලිම් කාන්තාවන්ට එසේ සම්බන්ධ වීමට තිබෙන ඉඩ අව ම ය.

- බොහෝ කාන්තාවෝ විවිධ සමාගම් විසින් ලබා දී ඇති පුහුණු වීම් තුළින් තම නිවෙස් තුළ කුඩා පරිමාණයේ නිෂ්පාදයන් හී නියැලී සිටිති. විශේෂයෙන් ම කාන්තා මූලික පවුල් කාබනික වගාවක් ලෙස බිම්මල් වගාව සමග වැඩි වැඩියෙන් සම්බන්ධ වී සිටිති.

- කාන්තා මූලික පවුල් වෙත ඇතැම් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් නිෂ්පාදන සහ වෙළෙඳාම් පහසුකම් සපයනු ලබයි. මෙම ආධාර විශේෂයෙන් ම ලබාදෙනු ලබන්නේ කාන්තාවන් සඳහා ය. කාන්තාවන් විසින් නිෂ්පාදනය කරනු ලබන ආහාර විස රහිත වන බැවින් එකී ආහාර සඳහා හොඳ පිළිගැනීමක් තිබේ.

- නැගෙනහිර පළාත සඳහා ආර්ථික මධ්‍යස්ථානයක් නොමැති වීම නිසා ඔවුන්ට (මඩකලපුවේ ජනයාට) දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය මත රඳා පැවතීමට සිදු ව තිබේ. බීජ මිල දී ගැනීම, ට්‍රැක්ටර් කුලියට ගැනීම (මිල දී ගැනීම) සහ අනෙකුත් සැපයුම් ලබා ගැනීම වෙනුවෙන් ජනතාව වැඩි වැඩියෙන් සමාගම් මත විශ්වාසය තබයි. පාරම්පරික ගොවිතැන් ක්‍රම නැවතත් ප්‍රාණවත් කරගත යුතු ය. එබැවින් සමාගම් මත රඳා පැවතීම අහිතකර වනු ඇත.

- පෝෂ්‍යදායී ආහාර ලබාදීම සඳහා ඉහළ අවධානයක් යොදවන්නේ කාන්තාවන් ය. විශේෂයෙන් මවුවරු මෙහිලා වැඩි උත්සාහයක් දරති. දරුවන්ට ආහාර ලබා දීමේ දී, ගැහැණු හා පිරිමි දරුවන් දෙපාර්ශවයට-ම වෙනසකින් තොර ව එක ලෙස ආහාර ලබාදෙනු ලබයි. ඔවුන් අතර අහාර සමානාත්මතාව ක්‍රියාත්මක වේ.

- ගෙවතු වගාවේ යෙදෙන කාන්තාවන් බීජ නිෂ්පාදනය, බීජ ගබඩා කිරීම හා පොහොර යෙදීම සඳහා ඔවුන්ගේ සාම්ප්‍රදායික ක්‍රමවේද භාවිත කරයි. නියගය වැනි ස්වභාවික විපත් ගොවීන්ටත්, ඔවුන්ගේ ආහාර සුරක්ෂිතතාවත් බලපෑම් කළ හැකි ය. සාමාන්‍යයෙන් කාන්තාවන් කෘෂිකර්මාන්තයේ නියැලෙන්නේ සිය අතිරේක කාලය තුළ ය. එමගින් ඔවුන්ට මානසික සහනයක් ද ලැබේ.

## නුවරඑළිය දිස්ත්‍රික්කය

- කාන්තාවන් කෘෂිකාර්මික ක්‍රියාකාරීත්වයන් තුළ ප්‍රධාන භූමිකාවක නියැලෙන නමුත් පසු-අස්වනු තීරණ ගනු ලබන්නේ පිරිමින් විසිනි. අස්වැන්න විකිණීම සහ මුදල් පරිහරණය සිදුවන්නේ පිරිමින්ගේ අභිමතය පරිදි ය. බිරිඳ අතට ලැබෙන්නේ ඉතිරිය පමණි.

- වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය තුළ කාන්තාවෝ විශාල දුෂ්කරතාවන්ට මුහුණ දෙති. එබැවින් එකී කටයුතු සඳහා පිරිමි මැදිහත් වෙති. ප්‍රධාන වෙළෙඳපොළේ දී කාන්තාවන්ට එහි සිටින පිරිමින් වෙතින් එල්ලවන විවිධාකාර ප්‍රශ්න වලට මුහුණ දීමට සිදු වේ. බොහෝවිට ඔවුන් කාන්තාවන්ට නියම මිල ලබාදෙන්නේ නැත.

- කාන්තාවන් පූර්ණකාලීන ගොවීහු නොවෙති. ඔවුහු සිය කාලයෙන් වැඩි කොටසක් නිවසේ වැඩකටයුතු සහ දරුවන් රැකබලා ගැනීම වෙනුවෙන් වැය කරනු ලබන අතර, ඉතිරි වන කාලය ගොවිතැන සඳහා යොදවති. කාන්තාවන්ට ගොවිතැන සමග ගෙදරදොර වැඩකටයුතුවල ද නියැලීමට සිදු වේ.

- විශාල ම ගැටලුව වන්නේ කාන්තාවන් ගොවීන් ලෙස සලකනු නොලැබීමයි. කාන්තාවන් සඳහා නායකත්වය හිමිකර දීමට ඇයගේ පවුලේ සාමාජිකයින් ඉදිරියට පැමිණිය යුතු ය. එමගින් සමානාත්මතාව මෙන්ම කාන්තාවන්ගේ වැඩිදියුණුව ද දැකිය හැකි වනු ඇත.

- සාමාන්‍යයෙන් කාන්තාවන්ට ගෙවනු ලබන්නේ අඩු වැටුපකි. එළවළු වගාවන් තුළ මෙන්ම නගරබද ව ඇති සාප්පු තුළ ද මේ තත්ත්වය දැකිය හැකි ය. කාන්තාවන් කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල නියැලී සිටිය ද, කෘෂිකර්මයේ බොහොමයක් බර වැඩ සිදුකරනු ලබන්නේ පිරිමින් විසිනි.

- වතුකරයේ ගොවි කාන්තාවන් සහ තරුණ කාන්තාවෝ විවිධාකාරයේ සූරාකෑම් වලට සහ ලිංගික හිංසාවන්ට ලක්වෙති. විශේෂයෙන් ම නගරබද ව විවිධ රැකියාවන් හී නියුතු කාන්තාවන් සූරාකෑමට ගොදුරු වෙති. නමුත්, ඊට එරෙහි ව යුක්තිය ඉල්ලා සිටීමේ උනන්දුවක් ඔවුන් වෙතින් පල නොවේ. ඒ පසුපස ඇති ප්‍රධාන ම හේතුව වන්නේ රැකියාව අහිමි වේ ය යන භීතිය යි.

- පාරම්පරික ව වගා කරනු ලබන ඉඩම් සඳහා කිසිදු ආකාරයේ ලේඛනයක් නැත. ලිපි ලේඛන රහිත ඉඩම් ද පිරිමින්ගේ අයිතියක් ලෙස සැලකේ. ඒවා පියාගෙන් පුතා ට හිමි වේ. වතුකරයේ බොහෝමයක් ජනයාට ඉඩම් අහිමි ය. වතුකරයේ සිවිල් පරිපාලන ව්‍යුහය තවමත් සරල කොට නැත.

- කෘෂිකර්මය හා සම්බන්ධ රාජ්‍ය සේවාවන් සාමාන්‍යයෙන් වතුකරයේ දී ලබාගත නොහැකි ය. විශේෂයෙන් ම රාජ්‍ය සේවාවන් සම්බන්ධ ව දැනුම්වත් භාවය වතුකරයේ ජනතාවට ලබා දෙන්නේ නැත. වතුකරයේ ජනතාව අතර රාජ්‍ය සේවාවන් සම්බන්ධ දැනුම්වත් භාවය ඉතා ම පහළ ය.

- පිරිමින්, කාන්තාවන්ට වඩා උසස් යැයි සැලකීමේ දුර්වලතාව කාන්තාවන් තුළ ද දැකිය හැකි ය. දේපොළ මිල දී ගැනීමේ දී හා පවුලේ ප්‍රධානියා ලෙස පිරිමියා ඉදිරියට දමන්නේ කාන්තාවන් ය.

- වාණිජ කෘෂිකර්මාන්තය සඳහා පොහොර හා කෘමිනාශක විශාල වශයෙන් භාවිත වේ. කෙසේ වෙතත් සිය පවුලේ අවශ්‍යතා සඳහා ඔවුහු කුඩා කාබනික වගාවක් පවත්වාගෙන යති. ආහාර සුරක්ෂිතතාව හා ගබඩා කිරීම පිළිබඳ ව වැඩි අවධානයක් නොමැත. ඒ සඳහා ඇවැසි වන්නා වූ විධිවිධාන ද මෙහි නැත.

## මුලතිව් සහ වවුනියා දිස්ත්‍රික්ක

ඉඩම් හිමිකාරීත්වය පුරුෂ කේන්ද්‍රීය වේ. ඉඩම් හිමිකාරීත්වය ලබා දී ඇත්තේ ද පවුලේ ගෘහ මූලිකයාගේ නමට ය. මේ ප්‍රදේශවල පිරිමියා පවුලේ ප්‍රධානියා ලෙස සැලකේ. ඉඩම් නීතිවල විවිධාකාර දුබලතා රැසක් පවතී. ඉඩම් ඔප්පු නිකුත් නොකිරීම මෙන්ම මායිම් ගැටලු ද බහුල ය.

ගොවි කාන්තාවන්ට ඇති විශාල ත ම ගැටලුව වන්නේ වෙළෙඳපොළ අවස්ථා නොමැතිකමයි. පිට පළාත් වලින් පැමිණෙන වෙළෙන්දෝ ඉතා අඩු මිලකට ඔවුන්ගේ අස්වැන්න රැගෙන යති. විශේෂයෙන් කාන්තාවන්ට නිෂ්පාදන සඳහා නිසි මිලක් නොලැබේ. ආහාර නිෂ්පාදනය පවත්වාගෙන යාම සඳහා ඔවුහු පාරම්පරික දැනුම භාවිත කරති. කෙසේ වෙතත් නවීන තාක්ෂණය වෙත ප්‍රවේශය අහිමි වීම මෙන්ම ඒ පිළිබඳ අවබෝධයක්-ද නොමැති වීම විසින් නවීන තාක්ෂණය ආහාර සුරක්ෂිතතාව සඳහා යොදාගැනීම වලකනු ලැබ ඇත. කාන්තාවන්ගේ ඵලදායීත්වය ඉහළ නැංවීමට නම් ඔවුන් ට පුහුණුව ලබාදීම මෙන් ම පුහුණුවෙන් පසු අධීක්ෂණය ද අවශ්‍ය ය.

නිවසේ වැඩකටයුතු මෙන් ම කෘෂිකාර්මික කටයුතු සඳහා ද කාන්තාවෝ උදවු කරති. ගෙදරදොර වැඩකටයුතු වැඩිවීමත් සමග කාන්තාවන්ගේ ආර්ථික සංවර්ධනයට විවිධාකාර බලපෑම් ඇති වේ. එබැවින් ඒ සම්බන්ධයෙන් පවුල් හා ප්‍රජා මට්ටමින් වෙනස්කම් අවශ්‍ය ය. පිරිමි දරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ඔවුන් රැකබලා ගැනීම කිරීම ගොවි ප්‍රජාවන් අතර සුලභ ය.

## මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක

කාන්තාවන් ගෙදරදොර වැඩකටයුතු සඳහා නායකත්වය ගනු ලැබුව ද, විශාල කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හිදී ඔවුහු නායකත්වය නොගනිති. පිරිමින් බර වැඩ කරන අතරතුර, කාන්තාවෝ ගෙවතු වගාව සහ සතුන් බලාගැනීම ආදී සැහැල්ලු කාර්යයන් හී නිරත වෙති. ගව පාලනය සහ ගෙවතු වගා ක්‍රියාකාරකම් සඳහා කාන්තාවන්ට උපකාර කිරීම සහ උනන්දු කිරීම රාජ්‍ය නොවන සංවිධාන විසින් සිදුකරයි.

ගොවි ගම්මානවල ජනයා තම දරුවන් කෘෂිකර්මයේ නියැලෙනු දැකීමට අකමැති ය. ඒ වෙනුවට ඔවුන් ට විධිමත් අධ්‍යාපනයක් ලබා දී නාගරික ප්‍රදේශවල යහපත් ජීවිතයක් ලබාදීම ඔවුන්ගේ අපේක්ෂාවයි. තම දරුවා අව ම වශයෙන් ගුරුවරයෙකු හෝ කිරීම ඔවුනගේ අභිලාෂය යි. පරම්පරා ගණනක් කෘෂිකර්මයේ නියැලී ඇත්තේ කිහිප දෙනෙකු පමණි.

කොරෝනා වසංගතය හේතුවෙන් නිවසට වී සිටින නිසා බොහෝ දෙනා ගෙවතු වගාවේ නියැලෙති. ඒවා කොරෝනා වසංගතයෙන් පසුව ද ක්‍රියාත්මක වුවහොත් එය විශාල සාර්ථකත්වයක් වනු ඇත. කෙසේ වෙතත් හුදෙක් ගෙවත්තේ අස්වැන්න පරිභෝජනය කළ පමණින් ඒවා ට හිමිවිය යුතු වටිනාකම ඔවුන් ට ලැබෙන්නේ නැත. ගෙවතු නිෂ්පාදන පිළිබඳ ව කිසිවකු සඳහනක් කළේ නැත.

දවස පුරා ගෙදරදොර වැඩ කටයුතු කිරීම වෙනුවෙන් කාන්තාවන්ට කිසිදු අගය කිරීමකට ලක් නොවේ. කාන්තාවන් රැකියාවක් කිරීම හෝ ගොවිතැනේ නියැලෙනු දැකීමට පවුල්වල සාමාජිකයින් අකමැති ය. කාන්තාවන් ව්‍යාපාරයන් හී නියැලෙන විට නිවසේ වැඩ කටයුතු සහ සැමියාගේ හා දරුවන්ගේ කටයුතු සඳහා කිසිවකු නැතැයි යන අදහසක් ඔවුන් ට ඇති වේ. කාන්තාවන් ව්‍යාපාරයන් හී නියැලෙන අවස්ථාවන් හි දී නිවසේ වැඩ කටයුතු පිළිබඳ ව වගකීම ගැනීමට පිරිමින් අකමැති ය. රජයේ සේවාවන් ලබාදීමේ දී ප්‍රමුඛතාව ලැබෙන්නේ පිරිමින් ට ය. උදාහරණයක් ලෙස, පැටවුන් බෝ කිරීම සඳහා ලබාදෙන සතුන් පිරිමින්ට ලබාදෙයි.



## ඇමිණුම 02:
### ඉලක්කගත නිර්දේශ

## 2.1 ස්වභාවික සම්පත් වෙත ප්‍රවේශය සහ පාලනය

- කාන්තාවන්ට ඉඩම් සඳහා ඇති අයිතිය සැලකිය යුතු ලෙස සීමාකරවන වෙනස්කොට සලකන නෛතික, ප්‍රතිපත්තිමය හා නියාමන භාවිතාවන් සංශෝධනය කිරීම.
- රජයෙන් ලබාදෙන සහායක සේවාවන් සඳහා සුදුසුකම් ලැබීමට ඉඩම් හිමිකාරීත්වය පූර්ව කොන්දේසියක් වන කෘෂි ව්‍යාප්ත සේවා කොන්දේසි සංශෝධනය කිරීම.
- ගොවි සංවිධාන සහ වාරිමාර්ග සංවිධානවලට සාමාජිකත්වය ලබාදීමේ දී කාන්තාවන් සඳහා ඉඩම් හිමිකාරීත්වය තිබීම අනිවාර්ය නොවන ලෙස යාන්ත්‍රණයන් වෙනස් කිරීම.
- ක්‍රියාකාරී වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ ඔවුන්ගේ සහභාගීත්වය දිරි ගැන්වීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ ආඥා පනත යටතේ ඉඩම් ලබාදීමේ දී ගොවි කාන්තාවන් ප්‍රමුඛතාගත කිරීම.
- ඉඩම් හිමිකාරීත්වයේ සිට වාරිමාර්ග යෝජනාක්‍රම සඳහා ප්‍රවේශය ලබාගැනීමේ දී ගොවි කාන්තාවන් මුහුණ දෙන ගැටලු විසඳීම අමාත්‍යාංශ මට්ටමේ සිට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සභා මට්ටම දක්වා වන රජයේ බලධාරීන්ගේ ප්‍රමුඛ කාර්යයක් බවට පත්කිරීම.
- ඉඩම් අහිමි ගොවිතැනේ නියුතු කාන්තාවන් ගොවීන් ලෙස සැලකිය යුතු වන බවත්, ඔවුන්ට ද සමාන රාජ්‍ය සේවාවන් ලැබිය යුතු බවත් ප්‍රවර්ධනය කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්තිමය කතිකාවක් නිර්මාණය කිරීම.

## 2.2 වෙළෙඳපොළ වෙත ප්‍රවේශය

- ගොවි කාන්තාවන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩි කිරීම සඳහා වන කෘෂි ව්‍යාප්ත සේවා වැඩසටහන් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- වෙළෙඳපොළ පද්ධතීන්, වෙළෙඳපොළ ඉල්ලුම, නිෂ්පාදන සහ සිල්ලර අලෙවිය පිළිබඳ තොරතුරු ගොවි කාන්තාවන් වෙත ගෙන යන යාවත්කාලීන කෙරෙන යාන්ත්‍රණයක් සැකසීම. ව්‍යාප්ති සේවා, කෘෂිකාර්මික නිලධාරීන් සහ ගොවි සමූපකාර ඔස්සේ ද මෙය ක්‍රියාත්මක කළ හැකි ය.
- ගොවි කාන්තාවන් ඉලක්ක කරමින් ප්‍රවාහන පහසුකම් සහ වෙළෙඳපොළ අවකාශයන් ඇතුළු යටිතල පහසුකම් සැකසීම.
- ගොවි කාන්තාවන් විසින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදන සඳහා වටිනාකම් එකතු කිරීම සහ වෙළෙඳපොළ අනන්‍යතාවක් ලබාදීම.
- කෘෂිකාර්මික ප්‍රජාව සහ වෙළෙඳපොළ පද්ධතීන් තුළ පාර්ශවකරුවන් හා අනාගත ගැනුම්කරුවන් අතර ගොවි කාන්තා නායිකාවන්, ව්‍යවසායිකාවන් හා තීරණ ගන්නන් ලෙස හඳුනාගන්නා සහ ප්‍රවර්ධනය කෙරෙන වැඩසටහනක් ආරම්භ කිරීම.
- විශේෂයෙන් ම ගොවි කාන්තාවන් ඉලක්කකරගත් වෙළෙඳපොළ සම්බන්ධතා ස්ථාපිත කිරීම (වෙළෙඳ ප්‍රදර්ශන ආදී)

## 2.3 මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය

- සමාගම් මගින් ලබා දෙන සියලුම අසාධාරණ ක්ෂුද්‍ර ණය අවලංගු කරන බවට ආණ්ඩුවෙන් ලබා දුන් පොරොන්දු ඉටු කිරීම

- ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් මගින් ලබා දෙන ක්ෂුද්‍ර ණය සඳහා දැඩි නියාමන හා අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

- ණය පහසුකම් ලබාදීමේ දී, වෙළෙඳපොළ සහ වටිනාකම් එකතු කිරීම හා සම්බන්ධ අමතර තොරතුරු හා සේවාවන් ලබාදීම.

- ඔවුන්ගේ සමූපකාර සහ අනෙකුත් සාමූහික නිෂ්පාදන හා අලෙවි කිරීමේ යාන්ත්‍රණයන් මගින් විශේෂයෙන් ම ගොවි කාන්තාවන් ඉලක්ක කරගත් දිගුකාලීන අඩු පොලී ණය යෝජනා ක්‍රම නිර්මාණය කිරීම.

- ගොවි කාන්තාවන් ට ලබාගත හැකි ණය පහසුකම් පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශය පහසු කිරීම.

- ණය සේවාවන් ලබාගැනීමේ දී පූර්ව කොන්දේසියක් ලෙස ලබාදිය යුතු ඇපකරයේ ස්වභාවය වෙනස් කිරීම.

## 2.4 තාක්ෂණය වෙත ප්‍රවේශය

- සියලුම තාක්ෂණික දැනුම සහ නිපුණතා පුහුණු පාඨමාලාවන් සඳහා පූර්ව කොන්දේසියක් ලෙස ගොවි කාන්තාවන්ගේ සමාන සහභාගීත්වයක් නියම කිරීම.

- පිරිමි වැඩ හා ගැහැණු වැඩ ලෙස ගොඩනැංවී ඇති සමාජ සම්මතයන් පිටුදැකීම සඳහා ගොවි ප්‍රජාවන් සහ කෘෂිකාර්මික උපදේශකයින් සංවේදී කිරීම.

- ගොවි කාන්තාවන් සඳහා පරිශීලක-හිතකාමී තාක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම.

- ප්‍රජා මට්ටමේ ව්‍යාපාර/ක්‍රියාකාරකම් සහ සමාජ මාධ්‍ය ඔස්සේ ගොවි කාන්තාවන්ගේ අනන්‍යතාව 'තාක්ෂණික දැනුමක්' සහිත අය ලෙස ප්‍රවර්ධනය කිරීම.

- ගොවි කාන්තාවන් අතර ඒකවරණ කටයුතු හඳුනා ගැනීම සහ ඒවා නැවත බෙදාහැරීම ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් රජයේ පාර්ශවකරුවන් හා සංවර්ධන ආයතන අතර ප්‍රතිපත්තිමය සංවාදයක් ස්ථාපිත කිරීම.

- කෘෂි ව්‍යාප්ත සේවා ලබාදීම සඳහා කාන්තා නිලධාරිනියන් බඳවා ගැනීම ඉහළ නැංවීම.

- ඵලදායීත්වය, වටිනාකම් දාමයට ඵලදායී අයුරින් සම්බන්ධ වීම යනාදිය සඳහා තාක්ෂණය භාවිත කිරීම පිළිබඳ දැනුම්වත්භාවය වැඩි කිරීම.

## 2.5 ගොවි කාන්තාවන් අතර රැකවරණ කටයුතු හඳුනා ගැනීම සහ ඒවා නැවත බෙදාහැරීම ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් රජයේ පාර්ශවකරුවන් හා සංවර්ධන ආයතන අතර ප්‍රතිපත්තිමය සංවාදයක් ස්ථාපිත කිරීම.

- නිෂ්පාදන ශ්‍රමය හා ගෘහස්ත ශ්‍රමය යන දෙක ම තුළ කාන්තාවන්ගේ දායකත්වය පිළිගන්නා අතර ම, ගොවි කාන්තාවන් මත රැකවරණ වගකීම් සඳහා අසමාන ලෙස බර පැටවීමෙන් වැලකීම පිළිබඳ ව මහජන කතිකාවක් නිර්මාණය කිරීම.
- නිවසේ වැඩකටයුතු පිළිබඳ වගකීම් සැපිරීම සඳහා ඉහළ මට්ටමේ පිරිමි සහභාගීත්වයක් තිබීමේ වැදගත්කම පිළිබඳ ව ගොවි ප්‍රජාවන් සංවේදී කිරීම.
- අව ම වශයෙන් වගා චක්‍රයේ තෝරාගත් කාලයන් සඳහා ගොවි කාන්තාවන් සාම්ප්‍රදායික ගෘහස්ත භූමිකාවන්ගෙන් නිදහස් කිරීම සඳහා ප්‍රජා මට්ටමේ දී අතිරේක සහාය පද්ධතියක් ස්ථාපිත කිරීම.
  උදා. ළමා රැකවරණ පහසුකම්, ආහාර බෙදාහැරීමේ යාන්ත්‍රණයන්.



## ඇමිණුම 03:
### බාධක ජයගත් ගොවි කාන්තාවන්ගේ සාර්ථකත්වයේ කතාන්දර

## නිදහස් බීජ: මොනරාගල ගොවි කාන්තාවන්

විශාල වශයෙන් හඳුනාගැනීමට ලක් නොවී තිබුණ ද, දේශීය බීජ ප්‍රභේද සහ සාම්ප්‍රදායික ගොවිතැන් භාවිතයන් හී භාරකරුවන් වශයෙන් ලොව පුරා කාන්තා ගොවීහු අඛණ්ඩ ව කටයුතු කරමින් සිටිති. තමන්ගෙ 'ම ප්‍රජාවන්ගේ සිට බහුජාතික සමාගම් දක්වා විවිධ මට්ටම්වල බාධක ගණනාවක් පනවා තිබුණ ද, දේශීය ආහාර පද්ධති ශක්තිමත් කිරීම සඳහා වන සිය ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩ ව පෙන්නුම් කරමින් සිටිති. දේශීය බීජ ප්‍රභේද රැකගැනීම පරම්පරා ගණනාවක් තිස්සේ කාන්තාවන් විසින් සිදුකරන ගෞරවයට පාත්‍ර වූ එවැනි කැපවීම් වලින් එකකි.

කිසිදු බාධාවකින් තොරව විශාල සමාගම් මගින් කෙරෙන දෙමුහුන් බීජ ප්‍රභේද ප්‍රවර්ධනය හේතුවෙන් ගොවීන් බීජ සඳහා සමාගම් මත යැපීම ඉහළ නැංවන අතර, එම බීජ වලට දේශගුණික විපර්යාසයන්ට අනුගත වීමේ හැකියාව නොමැත. මොනරාගල ගොවි කාන්තා කණ්ඩායමක් 1980 දශකයේ සිට සාම්ප්‍රදායික බීජ ප්‍රභේද සංරක්ෂණය කිරීම සඳහා වූ කාර්යයේ සාර්ථක ව නියැලී සිටියි.

ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය (UWWO) විසින් තම ප්‍රදේශයේ හොඳ බීජ ප්‍රභේද හිඟයක් ඇති බව වටහා ගත් අතර තම පාරම්පරික බීජ ප්‍රභේද සංරක්ෂණය කිරීමේ හා බෙදාහැරීමේ උත්සාහයන් පළමු ව ගොවි කාන්තාවන් 20 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකින් ආරම්භ කර තිබේ. ආරම්භයේ දී, කාන්තාවන් මාසික කමිටු රැස්වීම් තුළ බීජ හුවමාරු කරගැනීම ආරම්භ කර ඇති අතර, වසර ගණනකට පසුව එය මේ වන විට ගොවි කාන්තාවන් 100 ක පමණ සාමාජික පදනමක් සහිත ව බීජ බැංකු 05 ක් ස්ථාපිත කිරීම දක්වා වර්ධනය වී තිබේ.

1990 - 2000 දශකයන් තුළ අප ආහාරයට ගන්නා ආහාරවල බෝග විවිධත්වය 75% කින් පමණ අහිමි වී ඇති බව පර්යේෂණ මගින් පෙන්වා දෙයි (FAO, 2010). බහුජාතික සමාගම් විසින් ලබාදෙන දෙමුහුන්, ජානමය වශයෙන් වැඩිදියුණු කළ බීජ ප්‍රභේද හේතුකොටගෙන සුලු හා මධ්‍යම පරිමාණයේ ගොවීන් සමාගම් මත යැපීම ඉහළ නැංවී ඇත. එමගින් ගොවීන්ගේ කෘෂි රසායන භාවිතය සමස්තයක් ලෙස ඉහළ ගොස් ඇති අතර, ඔවුන් අතර බෝ නොවන රෝග මෙන් ම ණයගැතිභාවය ද වර්ධනය වී ඇත.

"කාන්තාවන් කෘෂිකර්මාන්තය තුළ මීට වඩා සක්‍රීය භූමිකාවක් හිමිකරගත යුතුයි. ආරම්භයේ දී අපේ මාසික රැස්වීම්වල දී මැ, බණ්ඩක්කා වර්ගවල දේශීය බීජ ප්‍රභේද නොමිලයේ ලබාදීම ආරම්භ කළා. පසුව අපි කාන්තාවන්ට ඔවුනොවුන් අතර බීජ හුවමාරු කරගැනීමට උනන්දු කළා. ඉක්මණින් ම අපි කුඩා ගබඩාවක් ආරම්භ කළා. එය මැටි මුට්ටි තුළ බීජ ප්‍රභේද ගබඩා කර ඇති රාක්කයක්. ඒ 1990 දශකයේ මුල් භාගයයි. ඒක ක්‍රමයෙන් සාර්ථක ව ක්‍රියාත්මක වන බීජ බැංකු පහක් දක්වා වර්ධනය වුණා'' යැයි කේ.පී.සෝමලතා ප්‍රකාශ කළා ය. ඇය බීජ සංරක්ෂණ ව්‍යාපාරයේ ආරම්භක සාමාජිකාවකි.

ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානයේ බීජ බැංකු මගින් මොනරාගල සිට අම්පාර, වවුනියාව, මඩකලපුව සහ අනුරාධපුරය දක්වා අඛණ්ඩ බීජ හුවමාරු කරගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කොට තිබේ.

පාරිසරික ව තිරසර සහ කාන්තාවන් නායකත්වය ලබාදෙන සාම්ප්‍රදායික ගොවි භාවිතාවන් ආරක්ෂා කිරීම සඳහා ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය වැඩ කරමින් සිටියි. ගොවි ප්‍රජාවන් හී දැඩි පුරුෂාධිපත්‍ය මධ්‍යයේ නායකත්වය සහ තීරණ ගැනීමේ භූමිකාවන්ට අවතීර්ණ වීම කාන්තාවන්ට අභියෝගාත්මක වූ ආකාරය කේ.පී.

සෝමලතා විසින් වැඩිදුරටත් විස්තර කරන ලදී. මොනරාගල ගොවි කාන්තාවන් කෘෂිකර්මාන්තය සඳහා ඉදිරියට ගෙන ඒම වෙනුවෙන් ධනාත්මක පරිවර්තනයක් ඇති කිරීමට උපායමාර්ගික ප්‍රවේශයන් දෙකක් ඔවුන් විසින් ගෙන තිබුණි:

1. ගොවි කාන්තාවන් අතර තාක්ෂණික ප්‍රවීණත්වය ඇති කිරීම: පරිසර හිතකාමී කෘෂිකර්මය පිළිබඳ තාක්ෂණික හැකියාව වර්ධනය කරගැනීම හේතු කොටගෙන වඩා හොඳ ගොවිතැන් ක්‍රම වෙත සිය පවුල නැඹුරු කරවීමේ දී පරිවර්තනීය කාර්යභාරයක් ඉටු කිරීමට කාන්තාවන්ට හැකි විය. දැනුම හා ප්‍රවීණතාව දරන්නන් කාන්තාවන් වන විට තීරණ ගැනීම සඳහා ද වැඩි වැඩියෙන් සම්බන්ධ වීමට ඔවුනට අවස්ථාව සැලසිනි.
2. ආර්ථික කටයුතු හා ආදායම් උත්පාදන අවස්ථාවන් නිර්මාණය කිරීම: ගොවි කාන්තාවන් සඳහා වෙළෙඳපොළ සම්බන්ධතා සහ වෙළෙඳපොළ ප්‍රවේශය නිර්මාණය කිරීම හා වටිනාකම් දාමයේ ඉහළ ට ගමන් කිරීමට අවස්ථාවන් ලබාදීම.

බීජ සංරක්ෂණය කිරීමේ උත්සාහයක් ලෙස ආරම්භ කළ ව්‍යාපාරය ක්‍රමික ව බීජ සංරක්ෂණ ව්‍යාපාරයක් ලෙස පරිණාමනය වී පසුව කාන්තා ගොවි නිෂ්පාදන කණ්ඩායම් වශයෙන් සම්බන්ධ කිරීම හා ඔවුන් වෙළෙඳපොළ සමඟ සම්බන්ධ කිරීම මගින් එය ව්‍යාපාර ආකෘතියක් වශයෙන් මේ වන විට ස්ථාපිත වී තිබේ. ප්‍රාථමික නිෂ්පාදකයින්ගේ භූමිකාව අත්පත් කර ගැනීමෙන් ඔබ්බට ගොවි කාන්තාවන්ගේ තත්ත්වය වටිනාකම් දාමය තුළ ඉහළ නැංවීම ද මෙම දැක්මේ කොටසක් විය. සාමාජිකාවන් විසින් රසායනික ද්‍රව්‍ය වලින් තොර පලතුරු, එලවළු හා පලා වර්ග නිෂ්පාදනය කිරීමේ දී සහභාගීත්ව සහතිකකරණ ක්‍රමවේදයක් මගින් කාබනික සහතිකකරණ ක්‍රමවේදය හඳුන්වාදෙන ලදී.

මෙම අගය එකතු කිරීමත් සමඟ ගොවි කාන්තාවන් ව්‍යසායකත්ව භූමිකාවක් අත්කර ගත් අතර, එමගින් ඔවුන්ගේ වත්මන් පාරිභෝගික පදනම ඌව පළාතේ ගොවි වෙළෙඳපොළේ සාමාන්‍ය ගොවීන් අභිබවා ගොස් තිබේ. නව තාක්ෂණය සමඟ කටයුතු කරන ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය එහි ගොවි කාන්තාවන් වෙනුවෙන් ෆේස් බුක් හා ඊ මේල් මගින් කාබනික එලවළු හා පලතුරු සඳහා ඇනවුම් භාර ගනී. මෙතුළින් මොනරාගල කාන්තාවන්ගේ නිෂ්පාදන කණ්ඩායම් පුළුල් පාරිභෝගික පදනමක් වෙත ළඟා වී ඇති අතර වේගයෙන් ඉහළ යමින් ඇති නැවුම් කාබනික නිෂ්පාදන ඉල්ලුමට ප්‍රතිචාර දක්වමින් සිටී.

මොනරාගල මෙම කාන්තා නායකත්වය සහිත බීජ සංරක්ෂණ යාන්ත්‍රණය ස්ථාපනය කිරීම මගින් ගොවි කාන්තාවන් ඔවුන්ගේ ප්‍රජාවන් තුළ බලය සඳහා අවකාශයක් සහ පිළිගැනීමක් නිර්මාණය කරගැනීමට සමත් ව ඇත. මෙමගින් ආර්ථික, සංස්කෘතික හා පාරිසරික වශයෙන් ධනාත්මක ප්‍රතිඵල නෙලා ගැනීමට ඔවුන් සමත්ව ඇත.

**මූලික ධනාත්මක බලපෑම්:**

- අන්තර් සංස්කෘතික සහයෝගීතාව වර්ධනය කිරීම: ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය මගින් පවත්වාගෙන යන බීජ බැංකු රට පුරා ගොවි කණ්ඩායම් සමඟ බීජ බෙදාගැනීමේ නියැලී සිටී. බීජ බෙදාගැනීම මගින් විවිධ ප්‍රදේශවල සාම්ප්‍රදායික දැනුම බෙදාගැනීමටත්, බෝග විවිධාගීකරණය ඉහළ නැංවීමටත්, විවිධ වාර්ගිකත්වයන්ට අයත් ගොවීන් අතර සහයෝගීතාව ශක්තිමත් කිරීමටත් අවස්ථාව ලැබී තිබේ.

- දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ ක්‍රියාවලියට සහාය වීම: දේශීය බීජ ප්‍රභේද දේශගුණිකව වඩාත් හොඳින් ඔරොත්තු දෙන අතර ඒවාට සාපේක්ෂ ව අඩු ජලය ප්‍රමාණයක් අවශ්‍ය වේ. එමෙන්ම කෘමි උවදුරු වලට ද හොඳින් ඔරොත්තු දෙයි. පාරම්පරික බීජ වගා කිරීම දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ සාර්ථක ක්‍රමයක් බවත්, එමගින් ගොවීන් කාලගුණික විපර්යාසයන්ට හා එහි දැඩි බලපෑම් වලට ගොදුරු වීමේ අවදානම අඩු කරන බවත් ඔප්පු වී තිබේ.

- කාන්තාවන්ගේ නායකත්වය ශක්තිමත් කිරීම: තාක්ෂණික දැනුම ධාරිතාව ඉහළ නැංවීම සහ ආර්ථික සම්බන්ධතාවන් සඳහා අවස්ථාවන් නිර්මාණය කිරීම හා ආදායම ඉහළ නැංවීම මගින් ගොවි කාන්තා නායිකාවන්, විශේෂඥයින් සහ ව්‍යවසායින් ලෙස හඳුනාගැනීමට අවස්ථාව උදාකර තිබේ. මෙම පිළිගැනීම හේතුකොටගෙන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇති පුරුෂ මූලික සමාජ සම්මතයන්ට අභියෝග එල්ල වී ඇත. එසේම, එමගින් ගොවි කාන්තාවන්ට තම බෝග වගා කිරීම හා අස්වනු නෙළීම හා සම්බන්ධ තීරණ ගැනීමේ ක්‍රියාවලියට නායකත්වය ලබාදීමට ද මඟ පෑ දී තිබේ.

- තිරසර කෘෂිකාර්මික භාවිතාවන් ප්‍රවර්ධනය කිරීම: ගොවි කාන්තාවන්ගේ මෙම නිෂ්පාදන කණ්ඩායම් කැප වී ඇත්තේ පාරම්පරික බීජ ප්‍රභේද ආරක්ෂා කිරීම සඳහා පමණක් නොවන අතර අවම කෘෂිකාර්මික යෙදවුම් සමඟ සාම්ප්‍රදායික බීජ ප්‍රභේද මගින් ඉහළ අස්වැන්නක් ලබාදෙන ආකාරයත් ඔවුහු පෙන්වා දෙති. තිරසර කෘෂිකාර්මික භාවිතයන් හී ආර්ථික හා පාරිසරික ප්‍රතිලාභ පිළිබඳ ව මෙම මොනරාගල ගොවි කාන්තාවන් තවදුරටත් ක්‍රියාකාරී ව පෙන්වා දෙමින් සිටිති.

- වෙළෙඳපොළ වෙත ප්‍රවේශය නිර්මාණය කිරීම: ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය මේ වන විට ෆේස්බුක් සහ ඊ මේල් මගින් පාරිභෝගිකයින් හා සම්බන්ධ ව සිටී. ඒ මගින් සමාජයී ය ව සවිඥානික පාරිභෝගිකයා සෘජු ව ගොවි කාන්තාවන් සමඟ සම්බන්ධ වීම පමණක් නොව පුළුල් වෙළෙඳපොළක් වෙත ප්‍රවේශ වීමට ද අවස්ථාව උදා කරයි. ගොවි කාන්තාවන් විසින් ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානයේ භූමිය තුළ පමණක් නොව ඌව පළාත තුළ හා කොළඹ තෝරාගත් මහජන අවකාශ කිහිපයක විකුණුම් ස්ථාන/භෞතික වෙළෙඳ අවකාශ ස්ථාපිත කොට තිබේ. තම නිෂ්පාදන සඳහා කාබනික සහතිකය ලබාගැනීම නිසා පුළුල් වෙළෙඳපොළකට පිවිසීමේ හැකියාව වර්ධනය වී ඇත.

## පරිවර්තනය සඳහා කෘෂි උපකරණ: මඩකලපුවේ ගොවි කාන්තාවන්

ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා වෙනස්කොට සැලකීමේ සමාජ සම්මතයන් හේතුවෙන් තම එදිනෙදා ජීවිතයේ- දී හෝ ජීවිකාවන් හී නිරත වීමේ දී තාක්ෂණය වෙත ප්‍රවේශ වීමට සහ භාවිත කිරීමට කාන්තාවන්ට බාධා පවතී. මෙම අවාසනාවන්ත සමාජ සම්මතයන්ගෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය ද වෙනස් නොවේ. ගෝලීය ව, ගොවි කාන්තාවන්ගේ ඵලදායීතාව සැසඳීමේ දී ගොවි කාන්තාවන්ගේ අස්වැන්න පිරිමි ගොවීන්ට 20-30% වඩා අඩු අගයක් ගනී. (IFAD, 2014). කෘෂි උපකරණ වෙත ප්‍රවේශය අහිමි වීම කෘෂිකාර්මික ඵලදායීත්වය තුළ ඔවුන්ගේ ශ්‍රමයේ ප්‍රශස්ත භාවිතය සීමා කිරීමේ ප්‍රධාන ම බාධකයක් බව පෙනී ගොස් ඇත.

ගොවි කාන්තාවන් අතර කෘෂි උපකරණ සහ තාක්ෂණික දැනුම ව්‍යාප්තිය සම්බන්ධ සමානාත්මතාව අහිමි වීමේ ගැටලුවට පිළිතුරු සෙවීමේ උත්සාහයක් ලෙස මඩකලපුවේ කාන්තා සංවිධානයක් කාන්තාවන්ට කෘෂි උපකරණ හා තාක්ෂනික දැනුම ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කොට තිබේ. මෙහි සැලකිය යුතු ජයග්‍රහණයක් වී ඇත්තේ කළින් කෘෂිකර්මාන්තයට ඇතුළු ව නොසිටි කාන්තාවන්ට ද කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් කැමැත්තත් ඇති කරවීමට එය සමත්වීමයි.

"කෘෂි උපකරණ වෙත ප්‍රවේශය අහිමි වීම නිසා ගොවි කාන්තාවන්ට ඉහළ ඵලදායීතාවක් ලැබීමට, වෙළෙඳපොළ වලට ප්‍රවේශ වීම සඳහා මූලප්‍රවාහගත වීමට, වටිනාකම් දාමයේ ඵලදායී සහභාගීත්වයට සහ සමස්ත පාඩු අවම කරගැනීමට නොහැකි වෙලා තිබෙනවා. ගොවි කාන්තාවන් තම කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල තවදුරටත් නියැලීම උනන්දු කිරීමත්, ඊට සමාන්තර ව තව තවත් කාන්තාවන් කෘෂිකර්මාන්තය ජීවනෝපායක් ලෙස තෝරාගැනීමට පොළඹවන පරිසරයක් කාන්තාවන් වෙනුවෙන් ඇති කිරීමටත් අපට අවශ්‍ය ය. අපේ ප්‍රදේශයේ සිටින බොහෝ පවුල් ඔවුන්ගේ ඉඩම් ඵලදායී ලෙස භාවිතයට නොගන්නා බවත්, ගෙවතු වගා සඳහා ඔවුන්ට ඉඩකඩ තිබෙන නමුත් එසේ කිරීමට කැමැත්තක් නොදක්වන බවත් අපට දකින්න ලැබුණා. නිවෙස්වල සිටින බොහෝමයක් කාන්තාවන් ඉවීමේ සහ පිරිසිදු කිරීමේ කටයුතුවල සීමා වී සිටින්නේ ඔවුන්ට ඊට වැඩි යමක් කිරීමට විශාල හැකියාවක් තිබිය දී ම යි. මේ සම්බන්ධයෙන් ඉලක්කගත මැදිහත් වීමක් අවශ්‍ය බව අපි වටහාගත්තා" යි රතී විට්ටි මහත්මිය පැවසුවා ය.

ප්‍රදේශයේ කාන්තා කෘෂිකාර්මික ශ්‍රම බලකාය මූලික වශයෙන් නුපුහුණු, ශ්‍රම සූක්ෂම නොවූ වටිනාකම් දාමයේ පහළ ම මට්ටම්වල රැකියාවේ නියුතු ව සිටින බව ඔවුන් විසින් හඳුනාගෙන තිබේ. ගොවි කාන්තාවන් වෙනුවෙන් ම සකස් කොට ඇති කෘෂිකර්ම ව්‍යාප්ති සේවා පවා සැලසුම් කර ඇත්තේ සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන්ට අනුව ය. ගොවි කාන්තාවන්ට පවුල් පෝෂණය, ගෘහස්ත ආහාර සුරක්ෂිතතාව, කාන්තා ගොවි සංවිධාන පිහිටුවීම ආදිය සම්බන්ධ විෂය කරුණු පිළිබඳ ව පුහුණුව ලබාදෙනු ලැබේ (කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව, 2014). දැනටමත් සැලකිය යුතු ජයග්‍රහණ අත්කරගෙන සිටින මෙම මැදිහත් වීම ඔස්සේ මඩකලපුවේ කෝරලේ පත්තුව, මන්මුනේ බටහිර සහ එරාවූර් පත්තුව ආදී කොට්ඨාශවල ගොවි කාන්තාවන් 300 දෙනෙකුට වඩා වැඩි පිරිසක් සම්බන්ධ කරගනිමින් ඔවුන් මුහුණ දෙන ව්‍යුහමය හා සංස්කෘතික බාධක වලට විසඳුම් සොයමින් සිටී.

ගොවි කාන්තාවන් සඳහා තිරසර හා සාධනීය වෙනසක් ඇති කිරීම සඳහා මෙම මුලපිරීම තුළ ප්‍රධාන උපායමාර්ග තුනක් ක්‍රියාත්මක කර තිබේ.

1. කෘෂිකාර්මික උපකරණ හා තාක්ෂණික දැනුම බෙදාදීමː පුරුෂමය අවකාශයන්ට/කාර්යයන්ට ඇතුළු වීමට හා සම්බන්ධ වීමට ගොවි කාන්තාවන් බලගැන්වීම මගින් කෘෂිකර්මාන්තය තුළ පවතින ඍණාත්මක ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘතිකරණයන් බිඳ දැමීම.

2. රාජ්‍ය නිලධාරීන් සමග සම්බන්ධතා ඇති කිරීමː ප්‍රදේශයේ කෘෂි නිලධාරීන් විසින් කෘෂිකාර්මික උපකරණ හා තාක්ෂණික දැනුම සම්බන්ධ ව ශක්‍යතා ගොඩනැංවීමේ මුලපිරීම් හා පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම. මෙම සම්බන්ධතා සහ ධනාත්මක අන්තර් සම්බන්ධතා විසින් ගොවි කාන්කාවන්ට වෙනත් ආකාරයකින් තමන් වෙත ළඟා නොවන රජයේ ව්‍යාප්ත සේවා වෙත ප්‍රවේශය හිමිකරදෙනු ඇත.

3. ගොවි කාන්තාවන්ගේ සමූපකාර නිර්මාණය කිරීමː ගොවි කාන්තාවන් සමූපකාර කණ්ඩායම් ලෙස සංවිධානය කිරීම මගින් ඔවුන්ට පුළුල් වෙළෙඳපොළ වෙත ප්‍රවේශය ලබාදෙනු ඇති අතර, කේවල් කිරීමේ හා ගනුදෙනු කිරීමේ වැඩි බලයක් ලබාදෙනු ඇත. සමූපාකාර මගින්, ක්ෂුද්‍ර ණය ලබාගැනීම්, ආදායම බෙදාගැනීම, තොරතුරු හා දැනුම බෙදාහැරීම සඳහා මූලප්‍රවාහීකරණය යනාදිය සිදුවන නිසා ගොවි ව්‍යාපාරවල තිරසර බව සහතික කිරීමට ඒවාට හැකියාව ලැබී තිබේ.

මෙම මූලපිරීම ආරම්භයේ සිට ම පාරිසරික ව තිරසර කෘෂිකාර්මික භාවිතයන් ප්‍රවර්ධනය කර තිබේ. කාන්තා නිෂ්පාදකයින් 300 දෙනා ම රසායනික වලින් තොර කාබනික ගොවිතැන් කටයුතුවල නිරත ව සිටිති. පුද්ගලිකව ගොවි කාන්තාවන්ට සහ කාන්තා ගොවි සමූපකාරවලට ලබා දී ඇති සහාය මගින් මූලික ව ම කාබනික පොහොරවල සිට තාක්ෂණික දැනුම හා උපකරණ ලබා දීම දක්වා ප්‍රදේශයේ කෘෂිකාර්මික නිලධාරීන් සමඟ සහයෝගී ව කටයුතු කිරීමට උපකාර කරනු ලැබේ. ද්විතීයික ප්‍රතිලාභයක් වශයෙන්, එමගින් රජයේ නිලධාරීන්ට ගොවි කාන්තාවන් සමඟත් අනෙක් අතට ගොවි කාන්තාවන්ට නිලධාරීන් සමඟත් සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමට අවස්ථාව ලැබී ඇත. ඒ හා සමාන ව ම, ගොවි කාන්තාවන්ට වුවමනා නම් අවශ්‍ය අවස්ථාවක දී ආරක්ෂිත මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය ලබාගැනීම සඳහා ප්‍රදේශයේ දේශීය බැංකු සමඟ ද සම්බන්ධතාවක් ගොඩනගා තිබේ.

ගොවි කාන්තාවන් අතර මෙම ඒකාබද්ධ හා සම්බන්ධීකරණ ආධාරක යාන්ත්‍රණය ස්ථාපිත කිරීම මගින් මඩකලපුව දිස්ත්‍රික්කයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘතිකකරණය පිටුදැකීමට පමණක් නොව ඔවුන් වෙත පුද්ගලික හා ප්‍රජා මට්ටමේ පුළුල් පරාසයක විහිදුනු ජයග්‍රහණ අත්කර දීමට ද සමත් ව ඇත.

**ප්‍රධාන ධනාත්මක බලපෑම්:**

- කාන්තාවන්ට වැඩි වැඩියෙන් කෘෂිකර්මාන්තයට පිවිසීමට උනන්දුවක් ඇති කිරීම: මෙම මුලපිරීමේ ලැබුණු විශාල ත ම ජයග්‍රහණය වන්නේ කිසිදු ආදායම් ඉපැයීමේ ක්‍රියාකාරකමක නොනියැලුනු කාන්තාවන්ට කෘෂිකර්මාන්තයට ඇතුළු වීම සඳහා උනන්දුව ඇති කිරීමට එය සමත් වීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස කාබනික ගොවිතැන යනු ආර්ථික ව ඵලදායී ජීවනෝපායක් බව කාන්තාවන්ට හා ඔවුන්ගේ සමස්ත ප්‍රජාවන්ට අවබෝධ කර දීමට හැකි වී තිබේ.

- ඵලදායී ඉඩම් පරිහරණය: ඵලාදායී ලෙස භාවිත නොකළ වගා කළ හැකි ඉඩම් සැලකිය යුතු ප්‍රමාණයක් මේ ප්‍රජාවේ නිවාස ආශ්‍රිත ව පවතී. වගාවන් ආරම්භ කිරීම සඳහා තාක්ෂණික දැනුම සහ උපකරණ සඳහා පුහුණු කළ සහ ශක්‍යතා ගොඩනංවනු ලැබූ කාන්තාවන් මෙම ඉඩම්වල වගා කිරීම ආරම්භ කොට තිබේ. එමගින් තම ගෙදරදොර පරිභෝජනය සඳහා මෙන් ම අමතර අස්වැන්න විකිණීම තුළින් ද කාන්තාවන් ආහාර නිෂ්පාදනයට යොමු ව තිබේ.

- කාන්තා නායකත්වය පෝෂණය කිරීම: වැඩි වැඩියෙන් කාන්තාවන් කෘෂිකර්මාන්තයට ඇතුළු වීමේ සහ කාන්තා කෘෂි සමූපකාර පිහිටුවීමේ සංයුක්ත ප්‍රතිඵලය වන්නේ ගොවි කාන්තාවන් විසින් නායකත්ව භූමිකාවන් භාරගැනීමට ඉදිරියට පැමිණීමයි. මිල ගණන් හා නිෂ්පාදනයේ ගුණාත්මකතාව තීරණය කිරීම, වෙළෙඳපොළ සොයා ගැනීම සහ ප්‍රජාව තුළ රාජ්‍ය හා පෞද්ගලික ක්ෂේත්‍රයේ වෙළෙඳපොළ මාර්ග සමඟ සම්බන්ධීකරණය කිරීමේ දී වන තීරණ ගැනීම් සම්බන්ධයෙන් කාන්තාවන් පෙර ට පැමිණ තිබේ. එසේ ම, ගෘහස්ත ආදායම ඉහළ නැංවීම සඳහා කාන්තාවන්ගේ දායකත්වය නිසා ගෘහස්ත වියදම් සිදු කළ යුතු ආකාරය සහ ඇයගේ කාලය කළමනාකරණය කරන ආකාරය සම්බන්ධයෙන් ද පැහැදිළි ව ම පෙනෙන ඉහළ ස්වාධීනත්වයක් ඇයට හිමි ව ඇත.



## අරගලයේ භූමිය, බලයේ භූමියඃ පානම ගොවි කාන්තාවන්

දුෂ්කරතා, අභියෝග සහ අහිමි වීම් හමුවේ නොපසුබට ව උත්සාහවන්ත ව සිටීමට තමන්ට ඇති හැකියාව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කාන්තාවන් විසින් ඔප්පු කර තිබේ. 2010 වසරේ දී ආසන්න වශයෙන් පානම පවුල් 350 ක් තම ඉඩම් වලින් බලහත්කාරයෙන් ඉවත්කරන ලදී. රාගම්වෙල හා ශාස්ත්‍රවෙල ගොවි ප්‍රජාවන්ට ඔවුන් වසර 40 ක් තිස්සේ වගා කරනු ලැබූ ඉඩම් එක් රැයින් අහිමි විය. මෙම නීති විරෝධී ඉඩම් කොල්ලය නිසා සිය ජීවනෝපායයන් අහිමි වූ ජනයා යුක්තිය ඉල්ලා දිගු නොපසුබට අරගලයකට අවතීර්ණ විය. එහි පෙරමුණ ගත්තේ ගොවි කාන්තාවන් ය.

තම ඉඩම් නැවත ලබාගැනීමට යුක්තිය සඳහා වූ මාවත දුෂ්කර එකක් වූ අතර, විවිධාකාරයේ දේශපාලනිකව මෙහෙයවනු ලැබූ බාධකයන්ට ද මුහුණ දීමට ඔවුන්ට සිදු විය. මෙම ව්‍යාපාරයේ ආරම්භයේ සිට ම, විවිධ මට්ටම්වල විරුද්ධවාදීන් සමඟ කටයුතු කරන අතර ම ප්‍රජා සාමාජිකයින් සහ හිතවතුන් සංවිධානය කිරීමේ හා කැඳවීමේ දී කාන්තාවන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලැබී ය. තම වගාබිම් වෙත ප්‍රවේශය අහිමිවීමෙන් පසු පරම්පරා ගණනාවක් ගොවිතැන් කළ පානම කාන්තාවන්ට දෛනික වැටුපට වැඩකිරීමෙන් ආදායම් උපයා ගැනීමට සිදුවිය. එමගින් ඔවුන්ගේ ගෘහස්ත ආර්ථිකය බිඳ වැටුණු අතර, ඔවුන්ගේ පවුල් බලවත් ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අනාරක්ෂිත භාවයකට පත්විනි.

මෙම ගොවි කාන්තාවන්ට එරෙහි වූ අසමානතාවන්ගේ අන්තර් ඡේදනයන් අතිමහත් ය. ඔවුන් කාන්තාවන් පමණක් නොවීය, ඔවුහු ග්‍රාමීය කාන්තාවන් ද වූහ; ඔවුන්ට සටන් වැදීමට සිදු වූ පුරුෂ මූලික බලවේග සාමාන්‍යයෙන් ප්‍රජාව තුළ හමුවන වැඩිමහල් පිරිමින් සහ ගැහැනුන් පමණක් නොවී ය. ඔවුන්ට හමුදාව සහ පොලීසිය ආදී ඉහළ බලවත් පුරුෂ මූලික බලවේගයන්වලට විරුද්ධව ද ස්වකීය ප්‍රතිරෝධය දැක්වීමට සිදුවිය. මේ සියලුම බාධක නොසලකා නැවතත් තම ඉඩම් ලබාගැනීමේ යුක්තිය සඳහා වූ ඉල්ලීම ඉදිරියට ගෙන යාමට කාන්තාවෝ කටයුතු කළහ. සමාන අදහස් ඇති සංවිධානවල සහයෝගයෙන් සහ ඉඩම් අයිතිය සඳහා වූ මහජන සන්ධානය (PARL) ආදී ජාලගතවීම්වල සහයෙන් පානම කාන්තාවෝ ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර මට්ටම් වලින් බලපෑම් කිරීමේ සහ උද්දේශන ප්‍රයත්නයන් හී නිරත වූහ.

අවසානයේ දී අතිවිශාල සාර්ථකත්වයක් සනිටුහන් කරමින්, 2016 දී ඔවුහු රාගම්වෙල තම ඉඩම් සඳහා ප්‍රවේශය ලබා ගැනීමට සමත් වූහ. වර්තමානයේ දී හතලිහකට වඩා වැඩි ගොවි කාන්තාවන් පිරිසක් එම ඉඩම්වල ක්‍රියාකාරී ව වගාවේ නිරත ව සිටිති. වරක් නීති විරෝධී ව කොල්ලකන ලද මෙම ඉඩම් සඳහා ප්‍රවේශය නැවත ලබාගැනීම ශ්‍රී ලංකාවේ ඉඩම් අයිතීන් සඳහා වූ උද්දේශනයේ ජයග්‍රහණයක් ලෙස සනිටුහන් වේ. මෙම ඉඩම් නැවත ලබා ගැනීමේ දී ඉඩම් අයිතිය සඳහා වූ මහජන සන්ධානය විසින් යොදාගත් මූලික උපායමාර්ග තුනක් ඉවහල් වී ඇත.

1. කාන්තාවන් සටන් පෙරමුණේ ඉදිරිපෙළ පිහිටුවීමඃ මූලික ව ම බලපෑම් කිරීමේ සහ උද්දේශන ප්‍රයත්නයන්හි දී මහජන පෙළපාලිවල සිට විරෝධතා, නඩු ආදිය දක්වා සැලසුම් කිරීමේ දී, ක්‍රියාවට නැංවීමේ දී සහ අධීක්ෂණය කිරීමේ දී කාන්තාවන් මූලික ව ම ගොවි කාන්තාවන් ඇතුළත් කිරීම කෙරෙහි ප්‍රමුඛතාව ලබාදෙන ලදී. යුක්තිය ඉල්ලා සිටීමේ දී මේ ප්‍රජාව තුළ කාන්තාවන් වඩා ඵලදායී සහ නොසැලෙන බව ඔප්පු විය.

2. උපදේශනය සහ බලමුලු ගැන්වීමේ හැකියාවන් වැඩි කිරීම: ඉඩම් අහිමිවීමට පෙර, මෙම ප්‍රජාව මූලික ව ම කෘෂිකාර්මික ජීවනෝපායයන් හී නියැලී සිටි අතර, සමාජ ක්‍රියාකාරී වීම පිළිබඳ ව කිසිදු අද්දැකීමක් ඔවුනට නොතිබුණි. ප්‍රජා සාමාජිකයින් හා වෙනත් සහාය ලබාදෙන්නන් කැඳවීම, බලමුලු ගැන්වීම, මාධ්‍ය සමඟ සම්බන්ධතා පැවැත් වීම, ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ සම්බන්ධ වීම සහ, ඉඩම් නීති, ප්‍රතිපත්ති හා මානව හිමිකම් පිළිබඳ ව දැනුවත් භාවය ඉහළ නැංවීම සඳහා ප්‍රජා සාමාජිකයින්ගේ, මූලික ව ම කාන්තාවන්ගේ ධාරිතාව ඉහළ නැංවීම ප්‍රජාව සඳහා සිදුකරන ලද ඇතැම් උත්සාහයන් අතර විය.

3. නැවත ලබාගත් ඉඩම් සංවර්ධනයට සහාය වීම: ප්‍රජාවට නැවතත් ප්‍රවේශය හිමි වූ ඉඩම් සංවර්ධනය සඳහා සහාය වීමට ඉඩම් අයිතිය සඳහා වූ මහජන සන්ධානයේ ජාලය බලමුලු ගන්වන ලදී. නිවාස ගොඩනැගීම සඳහා, ගොවිබිම් සැකසීම සඳහා සහ ප්‍රජාවට තම ජීවිත හා ජීවනෝපායයන් නැවත ගොඩනගා ගැනීමට සහාය වීම සඳහා සම්පත් ඒකරාශී කෙරින.

ඉඩම් සඳහා ප්‍රවේශය නැවත ලබාගැනීම පානම ඉඩම් අරගලයේ උච්චතම අවස්ථාව වූ නමුත්, ඔවුන් නැවතත් ස්ථාවර වන තුරු අඛණ්ඩ ව මේ කෘෂිකාර්මික ප්‍රජාව වෙත සහාය ලබාදෙන ලදී. පසුගිය වසර පහ පුරා ගොවි කාන්තාවන් 40 කට වඩා වැඩි පිරිසක් ක්‍රියාකාරී ව කෘෂිකර්මාන්තයේ නියැලුනු අතර වන්දි ලබාගැනීම සම්බන්ධයෙන් ප්‍රජාව සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වා තිබේ.

ඉඩම් නොමැති වීම සහ ඉඩම් වෙත ප්‍රවේශය නැතිවීම විසින් කාන්තාවන් කෘෂිකර්මයට සහභාගී වීම වලක්වන බව පමණක් නොව, නුපුහුණු කම්කරුවන් සහ වටිනාකම් දාමයේ ප්‍රාථමික නිෂ්පාදකයින් වශයෙන් ඔවුන්ගේ භූමිකාවන් එකතැන සිරවෙන බවත් පානම ඉඩම් අරගලය මගින් නැවත නිරූපනය විය. ඉඩම් වෙත ප්‍රවේශය සහ ඉඩම් හිමිකාරීත්වය යනු ගොවියෙකු ලෙස හඳුනාගැනීම සඳහා දායක වන ප්‍රධාන ත ම සාධකයක් වේ. වන සතුන්ගෙන්, ප්‍රාදේශීය සහ ජාතික මට්ටම්වල දේශපාලනඥයින්ගෙන් සහ කාලගුණික විපර්යාසයෙන් විවිධාකාර තර්ජන තිබුණ ද, පානම රාගම්වෙල නැවත ලබාගත් ඉඩම්වල කාන්තාවෝ තවදුරටත් ජීවත්වෙමින් වගා කටයුතුවල නියැලෙමින් සිටිති.

මුං, බඩ ඉරිඟු, රටකජු, මඤ්ඤොක්කා සහ එලවළු ඔවුහු වැඩි වශයෙන් වගා කරති. "අම්පාර සහ මොනරාගල වෙළෙන්දන් දැන් අපේ වගාවන් හා නිෂ්පාදන පිළිබඳ දැනුම්වත් නිසා, ඔවුන් අපේ නිෂ්පාදන මිල දී ගැනීමට අපේ ඉඩම ට ම පැමිණෙනවා. වගාවෙන් අපි උපයන ආදායමෙන් සැලකිය යුතු කොටසක් අවුරුදු ගාණක අරගලයකින් අපි නැවත ලබාගත්ත මේ ඉඩම සංවර්ධනය කිරීමට යොදවනවා" යැයි එස්. කුසුමාවතී මහත්මිය පැවසුවා ය. කුසුමාවතී 2010 සිට ම මෙම ව්‍යාපාරයට සක්‍රීය ව නායකත්වය දුන් ප්‍රධාන කාන්තා ගොවියෙකි.

අමතර ආදායම් ඉපැයීමේ ප්‍රභවයක් ලෙස ගොවි කාන්තාවන් ද පානම ප්‍රජා සංචාරක කර්මාන්තයේ විවිධ කාර්යයන් හි නියැලුණි. ඔවුන්ගේ කටයුතු විශාල වශයෙන් සංචාරක සමයන්ට සීමා වෙයි. සංචාරකයින්ට ආහාර සැපයීම, කුඩා පරිමාණයේ සංචාරක නවාතැන් ලබාදීම, ගමේ දිවා ආහාර සැපයීම ආදී භූමිකාවන් හී ඔවුහු නියැලුනහ. සංචාරක ව්‍යාපාරය, දේශීය ආහාර නිෂ්පාදනය සහ ගෘහස්ත ව්‍යාපාර හෝ අතුරු ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඇතුළු ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යවසායකත්ව මගින් කාන්තාවන් තමන් සහ තම ප්‍රජාවන් සඳහා ආදායම් උත්පාදනය කිරීමේ මාර්ගයන් හී නියැලීම වර්ධනය වෙමින් පවතින ප්‍රවණතාවකි (ජැක්සන් සහ ස්මිත්, 2004). එවන් අමතර ජීවනෝපාය මාර්ගයන් හී නියැලීමේ අවස්ථාවන් නිසා අම්පාරේ මෙම ගොවි කාන්තා කණ්ඩායම සිය අනුවර්තනය වීමේ හැකියාව සහ බහුකාර්යතාව තවදුරටත් ඔප්පු කර සිටියි.

පානම ඉඩම් අයිතිය සඳහා මෙම දිගුකාලීන ඒකාබද්ධ උත්සාහය එහි ප්‍රජාවට ප්‍රතිලාභ රැසක් හිමිකර දී තිබේ. මූලික ව ම කාන්තාවන් විසින් නායකත්වය ලබාදුන් මුලපිරීමක් වශයෙන් එම ව්‍යාපාරය වගා බිම්වල වැඩ කරන ග්‍රාමීය ගොවි කාන්තාවන්ගේ සමස්ත දැක්ම ඉහළ නැංවීමට දායක වී තිබේ.

**මූලික ධනාත්මක බලපෑම්:**

- ඉඩම් හා ජීවනෝපායන් ප්‍රතිස්ථාපනය කිරීම: නැවත ඉඩම් වෙත ප්‍රවේශය ලැබීම මගින් ඵලදායී කෘෂිකාර්මික ක්‍රියාකාරීත්වයන්ගෙන් බැහැර කරන ලද ගොවි ප්‍රජාවක් නැවතත් කෘෂිකර්මය සමඟ සම්බන්ධ කිරීමට හැකි වී තිබේ. නැවත වතාවක් තමන් කැමති ජීවනෝපායක් සඳහා මෙම ගොවි කණ්ඩායම සක්‍රීය කිරීම අවතැන් වූ ප්‍රජාවේ ජීවිත නැවත තිරසර ව ගොඩනැගීමේ අනිවාර්ය අංගයක් ලෙස තහවුරු විය.

- ආර්ථිකව සවිබල ගැන්වීම: 2010 දී ඉඩම් අහිමි වීම නිසා බොහෝමයක් ගොවි කාන්තාවන්ට ගල්කොරි සහ කුඹුරුවල අනියම් කම්කරුවන් ලෙස රැකියා කිරීමට සිදු විය. තමන්ගේ ම ඉඩම්වල වගා කිරීමට හා තම නිෂ්පාදන විකිණීමට හැකියාව ලැබීමෙන් අනිවාර්ය ලෙස ඔවුන්ගේ ආදායම වර්ධනය වූ අතර වඩා හොඳ නිෂ්පාදන හා සේවාවන්ට ප්‍රවේශ වීමට ඔවුන්ට හැකියාව ලැබුණි.

- අනන්‍යතාව නැවත ස්ථාපිත කිරීම: කෘෂි ප්‍රජාවන් තුළ ඉඩම පුද්ගලයාගේ අනන්‍යතාව සහ රැකියාව සමඟ සමීප ව බැඳී තිබේ. තමන්ගේ ම ඉඩම් වෙත ආපසු යාමට හැකිවීම නිසා පානම කෙරෙහි තමන්ගේ ම වූ හැඟීමක් ඇති කරගැනීමටත්, තම මුතුන් මිත්තන්ගේ මූලයන් සමඟ පැවති සබඳතා ශක්තිමත් ගැනීමටත් හැකි වී තිබේ.



## සාමූහික ඉතුරුම් තුළින් ආරක්ෂක යාන්ත්‍රණයක් නිර්මාණයඃ තඹුත්තේගම ගොවි කාන්තාවන්

මූල්‍ය සේවාවන් නොතිබීම නිසා යැපුම් ගොවිතැනින් වාණිජමය කෘෂිකර්මාන්තය කරා යාමේ දී කාන්තා ගොවීහු දුෂ්කරතාවන්ට මුහුණ දෙති. පහසුවෙන් ලබාගත හැකි ණය පහසුකම් බොහෝවිට බලවත් සූරාකෑමේ යාන්ත්‍රණයන් වන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තා ගොවීහු වඩාත් අවදානමට හා අසරණභාවයට පත් වෙති. මේ ගැටලුව සඳහා පිළිතුරක් ලෙස රජරට ගැමි ශක්ති නිර්මාණ කවය (RGNK) නම් තඹුත්තේගම ප්‍රජා සංවිධානයක් මගින් ගොවි කාන්තාවන් අතර ඉතිරි කිරීමේ කණ්ඩායම් පිහිටුවීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දී තිබේ.

නියාමනය නොකළ සූරාකන ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ප්‍රජාව තුළින් බැහැර කිරීමට සමත්වීම විසින් මෙම ඉතිරි කිරීමේ කණ්ඩායම්වල සාර්ථකත්වය ඔප්පුකොට ඇත. ග්‍රාමීය ගොවි කාන්තාවන්ට ණය පහසුකම්, මූල්‍ය ප්‍රාග්ධනය සහ ඉතිරි කිරීමේ යාන්ත්‍රණයන් ලබා ගැනීමට හැකි වන පරිදි නියාමනය කරන ලද මූල්‍ය සේවාවන් දුර්ලභ බැවින් මෙම කණ්ඩායම් තුළින් ක්‍රියාත්මක වන ඉතුරුම් ක්‍රමයක් රජරට ගැමි ශක්ති නිර්මාණ කවය මගින් සාර්ථක ව සැලසුම් කර ක්‍රියාත්මක කර තිබේ.

ඉතිරි කිරීමේ කණ්ඩායම් ගොවි කාන්තාවන් 10 - 15 දෙනෙකුගෙන් සමන්විත වේ. සෑම සාමාජිකයෙකු ම සතිපතා කණ්ඩායමට අමතර රුපියල් 125 ක් ලබාදිය යුතු ය. ගොවීන් ට මූල්‍ය සහාය අවශ්‍ය වූ විට, මෙම සාමූහික ආවර්තන අරමුදල මගින් සංවිධානය අරමුදල් මුදා හරිනු ලබයි. 2% ක පොලී අනුපාතයකට ණය ලබා දෙනු ලැබේ. ගොවීන් ට ආදායම ලැබෙන්නේ කන්නය අවසානයේ වන බැවින් ණය ගෙවීම සඳහා මාස 6 ක කාලයක් ලබා දෙනු ලැබේ. අවශ්‍ය ණය මුදලින් 20% ක් ඉතුරුම් අරමුදලට එකතු කර ඇත්නම් ගොවියෙකු ණයක් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

මෙම වැඩසටහනේ දී මූලික වශයෙන් වී ගොවිතැනේ නියැලෙන ගොවි කාන්තාවන් ඉලක්ක කර ගෙන තිබේ. සේවකයින් සඳහා ගෙවීම් කිරීමට සිදුවීම හෝ අනපේක්ෂිත ලෙස කෘෂිකාර්මික යෙදවුම් මිල දී ගැනීමට සිදුවන අවස්ථා සඳහා හදිසි කෘෂි ණය ලබා ගැනීමේ විකල්පය ද එමගින් ලබාදෙයි. මෙම මූල්‍ය ආධාර ක්‍රමය මගින් ගොවි කාන්තාවන්ගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම, නායකත්ව වැඩසටහන් සඳහා ඔවුන් සම්බන්ධ කර ගැනීම සහ ඔවුන් ට වෙළෙඳපොළ තොරතුරු සැපයීම යනා දී අමතර ප්‍රතිලාභ ද සැපයේ.

මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය නැතිවීමේ බාධක ජයගැනීම සඳහා ගොවි කාන්තාවන්ට සහාය සහ සේවාවන් සැපයීම සඳහා මෙම ක්‍රමයේ දී ප්‍රධාන උපායමාර්ග තුනක් අනුගමනය කරනු ලැබේ.

1. ගොවි කාන්තාවන් කණ්ඩායම් ලෙස සංවිධානය කිරීමඃ ඉතිරි කිරීම් කණ්ඩායම් ස්ථාපිත කිරීමෙන් ගොවි කාන්තාවන් අතර සමූහික විඥානයක් හා අනන්‍යතාවක් ගොඩනැංවෙනවා පමණක් නොව ඉහළ මට්ටමේ වගවීමක් ද ස්ථාපිත කෙරෙයි. ධාරිතාව ඉහළ නැංවීම, තොරතුරු ව්‍යාප්ත කිරීම සම්බන්ධ ඉලක්කගත සහයෝගය ලබාදීම මෙම කණ්ඩායම් ඔස්සේ අඛණ්ඩ ව සිදු කෙරේ.

2. ධාරිතාව ඉහළ නැංවීමඃ ඉතිරිකිරීම් කණ්ඩායම්වල සමාජිකයින්ට මූල්‍ය සාක්ෂරතාව, කාබනික වගාව සහ වෙළෙඳපොළ ඉල්ලුම හඳුනාගැනීම ආදිය සම්බන්ධයෙන් පුහුණු වීම් ලබාදෙයි.

3. කාන්තා නායකත්වය ප්‍රවර්ධනය කිරීම: සෑම ඉතිරි කිරීම් කණ්ඩායමකටම කාන්තාවක් නායිකාවක් වශයෙන් පත් කෙරේ. ඉතුරුම් කණ්ඩායම් සඳහා තෝරාගත් නායිකාවන්ට ඉලක්ක ගත නායකත්ව පුහුණුවක් ලබා දෙනු ලබයි.

ඉහත සඳහන් කළ කණ්ඩායම්වල ගොවි කාන්තාවන්ට පොත් තැබීම සහ ගිණුම් ශේෂය පවත්වා ගැනීම ඇතුළු තාක්ෂණික මූල්‍ය සාක්ෂරතා නිපුනතාවන් ලබාදෙනු ලැබේ. සියලුම ඉතිරි කිරීම් සහ ණය සම්බන්ධයෙන් වාර්තා ඔවුන් විසින් පවත්වාගෙන යා යුතු ය. රජරට ගැමි ශක්ති නිර්මාණ කවය විසින් තම ආදායම නැවත ආයෝජනය කිරීම ගොවීන් උනන්දු කරවීමත්, ඔවුන් ට මග පෙන්වීමත් සිදු කරන අතර හැකි සෑම විට ම සාමූහික ව වගා කළ හැකි ඉඩම් මිල දී ගැනීමට ඉතුරුම් කණ්ඩායම් යොමු කරවයි.

"සාමාන්‍යයෙන් ගොවි කාන්තාවන් ට ඇයගේ කියා ඉතුරුම් නැහැ. නමුත් අපේ ඉතුරුම් කණ්ඩායම්වල සිටින සෑම කාන්තා ගොවියෙකුගේ අතේ අඩු ම ගානේ රුපියල් 150,000 ක් විතර ඕනෑ ම වෙලාවක තියෙනවා. මේ මූල්‍ය නිදහස නිසා ඇය මුදල් අවශ්‍ය අවස්ථාවක දී අසරණ වෙන්නෙ නෑ. අපේ ඉතුරුම් කණ්ඩායම්වල නායිකාවන් සමාජය තුළ ආදර්ශමත් අය ලෙස සැලකෙනවා. අපි ඔවුන් ට මූල්‍ය කටයුතු පිළිබඳ ව පමණක් නොවෙයි කාබනික ගොවිතැන සහ වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ ව ත් ඔවුන්ගේ ධාරිතාව ඉහළ නැංවීමට අවශ්‍ය තාක්ෂණික කුසලතාවන් ලබා දී තිබෙනවා", යි මේ වැඩපිළිවෙළේ ආරම්භක සාමාජිකාවක වූ දමයන්ති කුලසූරිය පැවසුවා ය.

මෙම ආධාරක යාන්ත්‍රණය ස්ථාපිත කිරීම තුළින් ගොවීන් සහ ඔවුන්ගේ පවුල් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල සූරාකෑමේ ණය උගුල්වලට හසු වීමෙන් වැලකී තිබේ. විශේෂයෙන් ම ගොවීන් ඉලක්ක කරගත් දිගුකාලීන අඩු පොලී ණය යෝජනා ක්‍රම තුළින් ප්‍රජාව තුළ යහපත් වෙනස්කම් රාශියක් ඇති වී තිබේ.

**මූලික ධනාත්මක බලපෑම්:**

- වඩාත් ඉහළ මූල්‍යමය සාක්ෂරතාවක් සහිත ගොවි ප්‍රජාවක් නිර්මාණය කිරීම: මෙම මුලපිරීම මගින් ලැබුණු පුහුණුවෙන් පසු තඹුත්තේගම ග්‍රාමීය කාන්තා ගොවි ප්‍රජාවන් බොහෝ ඉහළ මට්ටමක මූල්‍ය සවිඥානිකත්වයක් සහිත ව ක්‍රියාත්මක වේ. ආදායම, වියදම්, ඉතුරුම් සහ ආයෝජන කළමනාකරණය කිරීමේ දැනුම්වත්භාවය, ගොවි කාන්තාවන් සවිබල ගැන්වීමකි. එමගින් ඔවුන් ට ඉහළ ව්‍යවසායකත්ව දැක්මක් ලබා ගැනීමට හැකි වී තිබේ.

- නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයන්ගෙන් ගොවීන් ආරක්ෂා කිරීම: මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය ලබාගැනීම සහ ඉතිරි කිරීම් හා ආයෝජන සඳහා මග පෙන්වීම් ලබාගැනීම මගින් මෙම ප්‍රජාවේ ගොවි කාන්තාවන්ට නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලින් බේරී සිටීමට හැකි ව තිබේ. මෙමගින් ගොවි කාන්තාවන් අධික පොලියට කෙටි ආපසු ගෙවීමේ කාලයන් සහිත ණය ලබා ගැනීම වැලකී ඇත. එබැවින් මෙම ගොවි ප්‍රජාවට ජීවිත පවා නැති කරන ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වලින් මූල්‍ය සේවා ලබා ගැනීමේ අවශ්‍යතාවක් නොමැත.

- ගොවි කාන්තාවන් නායිකාවන් ලෙස ප්‍රවර්ධනය කිරීමඃ කාන්තා ගොවි නායිකාවන් මගින් ඉතුරුම් කණ්ඩායම් ක්‍රියාත්මක වන හෙයින්, තීරණ ගැනීමේ හා පාලනයේ අවකාශයන් කාන්තාවන්ට හිමි විම පිළිබඳ ව පුළුල් ප්‍රජා පිළිගැනීමක් ලැබී තිබේ. කාර්මික දැනුම සහ වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ-ව ධාරිතාව ඉහළ නැංවීම මගින් ගොවි කාන්තාවන් ව ඔවුන්ගේ ප්‍රජාවන් තුළ පෙර ට වඩා බලවත් ස්ථානයක් හිමි ව ඇත.



## තිරසර වෙළඳපොළ පුළුල් වීම්: වලපනේ ගොවි කාන්තාවන්

ශ්‍රී ලංකාවේ ගොවි කාන්තාවන් ට ඔවුන්ගේ කෘෂි පරිචයන් වාණිජමය නිෂ්පාදන මට්ටමට ඉහළ නංවා වටිනාකම් දාමයෙන් ඉහළ ට ගමන් කිරීම සඳහා අවශ්‍ය වෙළෙඳපොළ සම්බන්ධතා සහ මූල්‍ය සම්පත් ඇත්තේ සාපේක්ෂ- ව අඩු ප්‍රමාණයකි. ගොවි කාන්තාවන් මුහුණ දෙන මෙම බාධකයට ප්‍රතිචාර වශයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රදේශයේ සංවර්ධන වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කර තිබේ.

කාබනික නොවන කෘෂිකර්මයෙන් කාබනික කෘෂිකාර්මික භාවිතයන් වලට විතැන් වීම සඳහා වන හිතකර පරිසරයක් ගොවි කාන්තාවන් සඳහා ඇති කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය. එසේ ම, වෙළෙඳපොළ තොරතුරු ලැබීම, වෙළෙඳපොළ වෙත ප්‍රවේශය, කේවල් කිරීම මෙන්ම සමස්තයක් ලෙස වෙළෙඳපොළ තුළ සිදුවන සියලු සාකච්ඡා ගොවි කාන්තාවන් පොරබදමින් සිටින විශේෂිත බාධක බව එහි දී හඳුනා ගෙන තිබේ. ඉහත සඳහන් අභියෝග විවිධ මට්ටම් වලින් විසඳීම සඳහා ඒකාබද්ධ විසඳුම් මාලාවක් ලබා දීමට එම වැඩසටහන මගින් උත්සාහ ගෙන තිබේ.

2014 ආරම්භයේ දී, කාබනික ගෙවතු වගාව සඳහා මූලික තාක්ෂණික දැනුම, උපකරණ සහ වෙනත් අත්‍යවශ්‍ය කෘෂිකාර්මික යෙදවුම් තෝරාගත් ගොවි කාන්තාවන්ට ලබාදෙනු ලැබිනි. ඉන්පසුව, නිෂ්පාදනයේ වර්ධනයට සමගාමී ව ලබා දුන් ආධාරක මට්ටම ද ඉහළ දමන ලදී. වෙළෙඳපොළ වෙත ප්‍රවේශය නිර්මාණය කිරීම, අගය එකතු කිරීමේ ක්‍රම හඳුන්වා දීම, සැපයුම් දාම පුළුල් කිරීම යනාදිය ද්විතියික මට්ටමේ දී සිදු කෙරිණි.

වර්තමානයේ දී මෙම ආධාරක ජාලය සමඟ ක්‍රියාකාරී ව සම්බන්ධ වූ වලපනේ කාන්තා ගොවීහු 300කට වඩා සිටිති. මෙම මැදිහත් වීමේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මූලික උපාය මාර්ග පහක් ක්‍රියාත්මක කර තිබේ.

1. අකාබනික කෘෂිකර්මාන්තයේ සිට කාබනික කෘෂිකර්මාන්තය දක්වා ක්‍රමානුකූල ව හා ක්‍රමික ව මාරුවීමට පහසුකම් සැලසීම: මුලින් සුළු වශයෙන් කාබනික ගොවිතැන් ක්‍රම හඳුන්වා දෙමින් මෙම වැඩසටහන මගින් ක්‍රමික ව අකාබනික ගොවීන් කාබනික ගොවීන් බවට පත් කර තිබේ. කාර්මික දැනුම, ගොවි උපකරණ, කාබනික පොහොර සහ අනෙකුත් කෘෂිකාර්මික යෙදවුම් ගොවීන්ට ලබා දීමෙන් පාරිසරික ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීමට හිතකර පරිසරයක් නිර්මාණය කරනු ලැබ ඇත. ගෙවතු වලින් ලැබෙන නිෂ්පාදනය ඉහළ යාමත් සමඟ ලබා දෙන ආධාරය ක්‍රමයෙන් ඉහළ නංවනු ලැබී ය.

2. කාන්තා ගොවි කණ්ඩායම් නිර්මාණය: මෙමගින් ගොවීන් අතර සාමූහික සවිඥානිකත්වයක් නිර්මාණය කෙරුනු අතර කේවල් කිරීමේ හා මිල තීරණය කරනු ලබන අවස්ථාවන් හී ඔවුන් ට සාමූහික ව පෙනී සිටිය හැකි විය.

3. අගය එකතු කිරීමේ යාන්ත්‍රණ හඳුන්වා දීම: සහභාගීත්ව සහතික ක්‍රමවේදය (Participatory Guarantee System) තුළින් කාබනික සහතික කිරීම, ඇසුරුම් කිරීම සහ ආහාර සැකසීමේ තාක්ෂණ හඳුන්වා දීම, පසු අස්වනු නාස්තිය අව ම කිරීම සඳහා අතිරික්ත නිෂ්පාදන භාවිත කිරීමේ යාන්ත්‍රණයන් හඳුන්වා දීම.

4. වෙළෙඳපොළ වෙත ප්‍රවේශය නිර්මාණය කිරීම: වෙළෙඳපොළ ඉල්ලුම සහ මිල ගණන් වැනි වෙළෙඳපොළ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබාදීම. ග්‍රාමීය කාන්තා නිෂ්පාදකයින්ට ආධාර කිරීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති වෙළෙඳපොළ වේදිකාවක් වන 'හරිත ප්‍රජා සංසදය' පිහිටුවීම තුළින් ගොවි කාන්තාවන්ට සහාය වීම.

5. පාරම්පරික පාරිසරික වශයෙන් තිරසර ගොවිතැන් ක්‍රම සඳහා ආධාර කිරීම සඳහා ඉහළ කෘෂි තාක්ෂණය හඳුන්වා දීම.

එළවළු මිල නිතර උච්චාවචනය වන අතර එයට ගොවීන් ගොදුරු වීමේ අවදානම ප්‍රජාවේ දක්නට ලැබුණු තීරණාත්මක බාධකයක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස කිසිදු ලාභයක් නොලැබුණ ද ගොවි කාන්තාවන් ට එයින් ඉවත් වීමට පවා හැකියාවක් නොතිබුණි. මුලින් ගොවීන් ට වර්තමාන වෙළෙඳපොළ මිල ගණන් නිශ්චිත ව පහසුවෙන් ලබා ගත හැකි වෙළෙඳපොළ තොරතුරු බෙදාහැරීමක් හඳුන්වා දෙන ලදී. කාබනික නිෂ්පාදන සඳහා මිල ගණන් ප්‍රමිතිකරණය කිරීමට මෙය උපකාරී විය. ගොවි කාන්තාවන් ට දැන් සිය ජංගම දුරකතන මගින් යාවත්කාලීන කරන ලද වෙළෙඳපොළ තොරතුරු ලබා ගැනීමට හැකි අතර අකාබනික නිෂ්පාදන හා සසඳන විට සිය කාබනික නිෂ්පාදන 20% වැඩි මිලකට අලෙවි කිරීමට ද හැකි වේ.

ක්ෂුද්‍ර හා සාර්ව මට්ටමින් මුහුණ දෙන අභියෝග විසඳීමට වලපනේ ගොවීන් මෙම මැදිහත් වීම මගින් උත්සාහ කර තිබේ. ගොවීන්ට වෙළෙඳපොළ වෙත ළඟාවීම සඳහා ආරක්ෂිත සහ කාර්‍යක්ෂ ම ප්‍රවාහන පහසුකම් සැපයීමට පවා එමගින් උත්සාහ කර තිබේ. මෙම මුලපිරීම අඛණ්ඩ ව ම සාර්ථක ලෙස ක්‍රියාත්මක වන අතර එය ආරම්භයේ සිට ම ගොවි කාන්තාවන්ගේ ජීවිතය හා ජීවනෝපාය මාර්ග ඉහළ නැංවීමට සමත් ව ඇත.

**මූලික ධනාත්මක බලපෑම්:**

- පාරිසරික වශයෙන් තිරසර කෘෂිකාර්මික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම: මේ වන විට 300 කට අධික ගොවි කාන්තාවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයෝ කාබනික කෘෂිකර්මාන්තයේ නියැලී සිටිති. තිරසර කෘෂිකාර්මික පිළිවෙත් සඳහා ගොවීන් වැඩි ප්‍රමාණයක් යොමු කිරීම සහ එවැනි මුලපිරීම් සඳහා ආධාර කිරීමට රජයේ කෘෂි නිලධාරීන් වැඩි වැඩියෙන් දිරිගැන්වීම අරමුණු කොටගත් ආකල්පමය වෙනසක් ඇති කිරීමේ සහ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් අඛණ්ඩ ව සිදුවෙමින් පවතී.

- නව වෙළෙඳපොළවල් ඇති කිරීම: ගොවි කාන්තාවන් ට සහාය වීම සඳහා නව වෙළෙඳපොළ අවකාශ ස්ථාපිත කර තිබේ. හරිත ප්‍රජා සංසදය මගින් වලපනේ සතිපතා ගොවි වෙළෙඳපොළ ට අමතර ව, ගොවීන් ට තම නිෂ්පාදන පුළුල් සේවාදායකයින් පිරිසකට විකිණීමට හැකි වී තිබේ. සුපිරි වෙළෙඳ සැල් සහ අනෙකුත් මහා පරිමාණ වෙළෙන්දන් සමඟ විධිමත් හා කාර්‍යක්ෂ ම සැපයුම් දාමයන් ස්ථාපිත කිරීමත් සමඟ නිරන්තර ඉල්ලුම හා සැපයුම් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ. නව වෙළෙඳපොළවල් ව්‍යාප්ත කිරීම මේ වන විට කාබනික නිෂ්පාදන අපනයනය කරන මට්ටමකට පැමිණ තිබේ.

- ඉහළ මට්ටමේ තාක්ෂණික ව්‍යාප්තිය: ගොවි කාන්තාවන් ට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා තාක්ෂණය සහ යටිතල පහසුකම් ලබා දී තිබේ. පුහුණුව හා දැනුම ලබාදීමේ සිට මෙවලම් හා යන්ත්‍රෝපකරණ සැපයීම දක්වා වූ නව්‍යකරණයක් මගින් මෙම කාන්තා ගොවි ප්‍රජාව කෘෂිකර්මාන්තය සඳහා නව දැක්මක් ලබා දී තිබේ.

- කාන්තා නායකත්වය ශක්තිමත් කිරීම: සහභාගීත්ව සහතික ක්‍රමවේද පද්ධතියේ, තත්ත්ව පරීක්ෂා කිරීමේ සහ දැනුම හා තොරතුරු බෙදාහැරීමේ නියෝජිතයින් වශයෙන් ගොවි කාන්තාවන් පත් කරනු ලැබ ඇත. ඉලක්කගත තාක්ෂණික හැකියාවන් ඇති කිරීම සහ ඉහළ වගකීමක් සහ පාලනයක් ලබාදීම මගින් නොවැලැක්විය හැකි ලෙස ගොවි කාන්තාවන් ප්‍රජාවේ නායකයින් හා තීරණ ගන්නන් ලෙස පිළිගැනීමට ඉඩ සලසා තිබේ.




SOMETHING

**ආහාර පද්ධතීන් පරිවර්තනයෙහිලා කාන්තාවන්ගේ කාර්යභාරය:**

**ජනතා ආහාර පද්ධතියක් උදෙසා  සිවිල් සමාජ සංවිධාන නිර්දේශ**

**නීතිය සහ සමාජ භාරය සහ සවිස්ත්‍රී කාන්තා ව්‍යාපාරය විසින්, We Effect  සමග**

**සිදුකරන ලද ජනතා අදහස් විමසීමේ සැසි මත පදනම් ව සකස් කරනු ලැබූ ඒකාබද්ධ වාර්තාව**

**හවුල්කාරීත්වය:**

WE EFFECT

**ක්‍රියාත්මක කිරීම:**

LAW & SOCIETY TRUST

SAVISTHRI

මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ස්වීඩන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය (Sida) හා (We Effect) අරමුදලින් මුද්‍රණය කර ඇත. මෙහි එන අදහස් හා අන්තර්ගතයන්ට Sida හෝ We Effect ආයතන එකඟවීමක් අත්‍යවශ්‍යයෙන් ම නොවන අතර එය කතෘ හා ප්‍රකාශන ආයතනයේ වගකීම වේ.